The Journal of Studies in Humanities

Volume 6 (II) 2020

Department of Humanities, Rajarata University of Sri Lanka

# මානව ලිංගිකත්වයෙහිලා බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් හඳුන්වාදෙන ස්ත්‍රී - පුරුෂ සන්නිවේදන සම්බන්ධතා ආකෘතිය

නන්දන මිල්ලගල

***Correspondence:***
nandana.millagala58@gmail.com

***Specialty Section:***
Mass Communication

***Received:***
30 September 2021

***Revised:***
05 August 2022

***Accepted:***
07 August 2022

***Published:***
02 January 2023

***Citation:***
මිල්ලගල, නන්දන. (2020). මානව ලිංගිකත්වයෙහිලා බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් හඳුන්වාදෙන ස්ත්‍රී - පුරුෂ සන්නිවේදන සම්බන්ධතා ආකෘතිය. *මානවශාස්ත්‍ර අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය.* 6(11), 17-46.
ISSN (Online): 2961-564X
ISSN (Print) : 2362 - 0706

## Abstract

Sex is a dominant factor in the relationship between men and women. Human gender is decided at birth. Structures of social relations are formed according to the roles and responsibilities of men and women. Marriage, family, sexuality and reproduction are the social roles of the male-female relationship. Communication underpins male-female and all human relationships. The main purpose of this study is to find the structural form of male-female relationship in human sexuality in the form of a model based on the Buddhist source. Taking several Buddhist sermons that explain the central concept as a sample, it is anxious to develop the proposed model according to communication principles. It is a complex task to translate Buddhist conceptual perspectives into a communication model that structurally expresses male-female relationships related to human sexuality. In it, it is known that

human relationships are proven through the main factors of communication source, communicator, message, media or channel, receiver and feedback and when the two sides of the communicator and receiver are interpreted as male and female, it can be constructed a model that reveals human sexual relations. In this model, which is presented in two steps, firstly, the way in which male-female relationships are formed according to the roles and their aims have been analyzed. Secondly, as a more developmental model, the factors explained in Buddhism such as senses, actions, attitudes, forms, will, tone and beauty between the male and female parties are analyzed in human sexual relations. This investigation was conducted using the primary written source related to Buddhism and communication through qualitative research method and thematic and content analysis. By introducing a new model to the field of communication, several conclusions and suggestions have been presented to successfully support male-female sexual relations in human society with mutual understanding.

***Keywords:*** Buddhism, male-female, relationships, reproduction, sexuality

**හැඳින්වීම**

ලිංගය (ලිඞ්ගය) ස්ත්‍රීත්වයේ හෝ පුරුෂත්වයේ නිරූපණය යි. එය ගැහැනු බවේ හෝ පිරිමිබවේ ඇඟවුම වේ. එසේ ම ස්ත්‍රීවේශය, පුරුෂවේශය හෝ ස්ත්‍රී, පුරුෂ හැඩරුව යන අදහස ද ගත හැකි ය. ලිංගය යන්නෙන් ලකුණ, චිහ්නය, ආකාරය, සටහන යන අර්ථය ද මතුවේ. එනම්, ස්ත්‍රී හෝ පුරුෂ ශරීරයට ආවේණික වූ ලකුණු, ආකාර, සටහන් ආදියයි. එම ලකුණු අනුව ස්ත්‍රීන් හා පුරුෂයන් වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි ය. ස්ත්‍රී ශාරීරික ලකුණුවලින් ස්ත්‍රී අනන්‍යතා සන්නිවේදනය වන අතර පුරුෂ ශාරීරික ලක්‍ෂණවලින් පුරුෂ අනන්‍යතා සන්නිවේදනය වේ. ඒ අනුව මිනිසුන් අතර මුඛ්‍යතම බෙදීම වන ස්ත්‍රී පුරුෂභාවය තහවුරු කිරීමේ දී ඔවුනොවුන්ගේ ශාරීරික ලක්‍ෂණ මගින්ම සන්නිවේදනය සිදු වේ. මෙය මානව සමාජයට මෙන් ම සත්ත්ව සන්තතියට ද අදාළ වන්නකි. ගැහැනු සතුන් සහ පිරිමි සතුන් ශාරීරික ලක්‍ෂණ මගින් වෙන් වෙන්ව හඳුනාගත හැකි ය. ඇතැම් සතුන් දර්ශන මාත්‍රයෙන් ම ස්ත්‍රී, පුරුෂ අනන්‍යතාව ප්‍රකට වන අතර ඇතැම් සතුනගේ ඉරියව්, චර්යා රටාවන් මගින් එය සන්නිවේදනය කරගත යුතු ය. ඒ අනුව ''ලිංගය'' යන්නෙන් ජීවීන් සතු ස්ත්‍රී, පුරුෂ බව අර්ථවත් වේ. මිනිසුන් අතර ස්ත්‍රී - පුරුෂ අනන්‍යතාව හෙවත් පුම්තිරි බව නිරූපණය වන්නේ ලිංගිකත්වය පදනම් කරගෙන ය. ඔවුන් අතර සන්නිවේදනය සිදුවන්නේ ජීවවිද්‍යාත්මක ප්‍රවේශයක් සහිතව ය. ස්ත්‍රී - පුරුෂ ලිංගිකත්වය අනුව සන්නිවේදනයේ ආවේණික ලක්‍ෂණ ඇති වේ. ඔවුනොවුන් සිතන පතන ආකාරය, දේහ ලක්‍ෂණ, චර්යාවන්, සහ පෞරුෂත්වය ආදී සියල්ලක් ම ලිංගිකත්වයට අනුව ක්‍රියාත්මක වේ. එය ජෛව

රසායන ක්‍රියාවලියක මෙන් ම සමාජභාවී ව්‍යවහාරයකි. සමාජානුයෝජනය, තත්ත්වය හා කාර්යභාරයන් නියමවීමේ දී ද මෙය බලපායි. මෙම පර්යේෂණයේ දිශානතිය මානව ලිංගිකත්වයේ දී (Human Sexuality) සිදුවන ස්ත්‍රී - පුරුෂ සන්නිවේදන සම්බන්ධතා කේන්ද්‍රකරගනිමින් සිදු වේ.

### අරමුණු

මෙම පර්යේෂණ අධ්‍යයනය මගින් මානව ලිංගිකත්වයේ දී ස්ත්‍රී - පුරුෂ සන්නිවේදන සම්බන්ධතා පිළිබඳ මුඛ්‍ය වශයෙන් විමර්ශනය කෙරේ. එය ජෛව රසායන හා සමාජ මනෝවිද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ විමසා බැලීමට උත්සුක වේ. බෞද්ධ සූත්‍ර පිටකයට සම්බන්ධ දේශනාවන් කීපයක් ආශ්‍රිතව මානව ලිංගිකත්වය සහ ස්ත්‍රී - පුරුෂ සම්බන්ධතා අධ්‍යයනය කරමින් නව සන්නිවේදන ආකෘතියක් හඳුන්වාදීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණක් වේ.

### ක්‍රමවේද

ප්‍රධාන වශයෙන් මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Qualitative Research Methodplogy) භාවිත කරයි. මානව ලිංගිකත්වය හා ස්ත්‍රී - පුරුෂ සන්නිවේදන සම්බන්ධතාවල පවත්නා ජෛව රසායන හා සමාජ මනෝවිද්‍යාත්මක ගුණාකාරයන් පිළිබඳ මුඛ්‍ය වශයෙන් සැලකිලිමත් වේ. ප්‍රමාණාත්මක ක්‍රමවේදය (Quantitative Method) මඳ වශයෙන් භාවිත කළ යුතු අවස්ථා පවතී. එසේ ම පුස්තකාලය අධ්‍යයනය, ලිඛිත මූලාශ්‍රය ගවේෂණය යොදාගන්නා අතර අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය (Content Analysis Method) මගින් බෞද්ධ සූත්‍රාගත දේශනාවන්හි කරුණු අධ්‍යයනය කෙරේ. විග්‍රහාත්මක හා අර්ථකථනාත්මක ක්‍රමවේදයන් ඔස්සේ ගැඹුරු විශලේෂණයන් සිදු කරමින් ස්ත්‍රී - පුරුෂ සන්නිවේදන සම්බන්ධතාවලට අදාළ නව ආකෘති හඳුන්වාදීමට යොමු වී ඇත.

### සාකච්ඡාව

පිරිමි බව හා ගැහැනු බව (Male and Female) ජීවීන් සතු ප්‍රමුඛතම අනන්‍යතා ලක්‍ෂණය යි. දේහමය ලක්‍ෂණ සහ කාර්යමය තත්ත්වයන් මත ස්ත්‍රී - පුරුෂභාවය පදනම් වේ. ඇස, කණ, නාසය, මුහුණ, අත්පා ආදිය දෙපාර්ශවයට ම පොදු වුව ද ස්ත්‍රී පුරුෂභාවය අනුව ඒවායේ ද වෙනස්කම් හෙවත් ආවේණික ලක්‍ෂණ ඇති වේ. එහෙත් පියයුරු, ලිංගේන්ද්‍රිය ආදිය ශාරීරික වශයෙන් කැපී පෙනෙන වෙනස්කම් නිරූපණය කරයි. එසේ ම එකී ශාරීරික අවයව මෙහෙයවා කරන කතාබහ, ඇවතුම් පැවතුම්, ගමන් විලාසාදියේ දී එකිනෙකාගේ අනන්‍යතාවන් වඩාත් ම ප්‍රකට කෙරේ. ස්ත්‍රී පුරුෂ ලිංගික අවයව පමණක් නොව එම අවයව දරන සමස්ත වේශය ම හැඳින්වීමට ලිංග යන පදය යෙදේ.

''පිරිමි හා ගැහැනු ජීවීන් වෙනස්කොට හඳුනාගැනීමට ඉවහල්වන ව්‍යුහමය හා කාර්යමය ලක්ෂණ සමස්තය'' ලිංගය යන වචනයේ අර්ථය යි. (හරිශ්චන්ද්‍ර, 2008 :) ලිංගිකත්වය සමාජ ලිංගිකත්වය, පුම්තිරි බව, ස්ත්‍රී පුරුෂභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනාදී සිංහල යෙදුම්වලින් අභිප්‍රේරක වන්නේ ඉංග්‍රීසි භාෂාවේ **GENDER** යන වචනයෙන් කියැවෙන අරුත ඉදිරිපත් කිරීම යි" (අභයසුන්දර, 2003 : 96).

''ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ භේදය සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන්නේ එකම අර්ථයක් ගෙන එන ලෙස ය. නමුත් මානව විද්‍යාව මෙය එකක් නොව දෙකක් ලෙස දකී. ජීව විද්‍යාත්මකව ස්ත්‍රී, පුරුෂ භේදයක් ඇත. ක්‍රෝමසෝම හා හෝමෝන වෙනස කායික වෙනස්කම්වලින් ස්ත්‍රී පුරුෂභේදය හඳුනාගත හැක. ලිංගිකත්වය කියන්නේ ලිංගභේදයට නොව තත්ත්වය හා කාර්යභාරය සලකා පිරිමි ගැහැනු වෙනස්කමට ය.'' (රත්නපාල, 2001 : 89)

අනුව ලිංගය (Sex) සහ ලිංගිකත්වය (Gender) යන ව්‍යවහාරවල වෙනස්කම් පවත්නා බැව් පැහැදිලි වේ. යම් ජීවියකු කෙරෙහි පිහිටා ඇති ගැහැනු බව හෝ පිරිමි බව ලිංගය යන්නෙන් අර්ථවත්වේ. සකල ශරීරාවයවවලින් හා ශරීරාභ්‍යන්තරික ක්‍රියාවලීන් මගින් එය ප්‍රකට වේ. එහෙත් ස්ත්‍රී පුරුෂ භේදය හෙවත් ලිංගභේදය (Gender) සම්බන්ධ අනන්‍යතා ප්‍රකට කරනු ලබන්නේ සමාජ, සංස්කෘතික අවස්ථා හා බලපෑම් පදනම් කරගනිමිනි.

''ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු හුදෙක් මනෝවිද්‍යාත්මක හා සංස්කෘතිකමය අර්ථදැක්වීමක් පමණි. ලිංගභේදය දැක්වීම සඳහා වඩාත් යෝග්‍ය යෙදුම් ස්ත්‍රී (Female) හා පුරුෂ (Male) වන්නේ නම් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අවධාරණය කිරීමට වඩාත් යෝග්‍ය හා නිවැරදි යෙදුම වන්නේ ස්ත්‍රීත්වය හා පුරුෂත්වය (Femimine and Masculine) යන වහර ය. ජීව විද්‍යාත්මක වෙනස්කම්වලින් මෙම යෙදුම් වඩාත් ස්වාධීන බවක් දරයි. (Stoller,1968;09) මෙම ස්ත්‍රී පුරුෂ ප්‍රභේදය, වෙනස් වූ අනන්‍යතාව ම ප්‍රබල ජීවවිද්‍යාත්මක හා සමාජ ක්‍රියාවලියක අත්‍යවශ්‍ය සාධක ගණනාවක් සහිත වේ. ජීවවිද්‍යාත්මකව ඒ ඒ ශරීරාවයව ක්‍රියාකාරීත්වයන් පෙළගැසෙන්නේ සමාජමය වශයෙන් ස්වභාවිකව පැවරුණු කාර්යභාරයන් සමූහයක් ඉටු කිරීමට ය.

"සමාජවිද්‍යා ක්ෂේත්‍රයේ දී ලිංගිකත්වය යන වචනය යෙදිය යුත්තේ පුල්ලිංගික, ස්ත්‍රී ලිංගික වශයෙන් සමාජීයව නිර්මාණය කරනු ලබන සමාජවිභජනය හඳුන්වාලීම පිණිසයි." (අභයසුන්දර, 2001;97) ඒ අනුව ලිංගිකත්වය යන යෙදුම ස්ත්‍රී පුරුෂ සමාජභාවය (Gender) යන ව්‍යවහාර එකම ක්‍රියාවලියක සියුම් වෙනස්කම් සහිතව භාවිත කරන යෙදුම් බව පැහැදිලි වේ.

> "Gender- refers to ways of seeing and representing people and situations based on sex duffevince. By contrast 'sex' is a biological category: female or male. The term sexuality refers to the realm.....".
>
> (Goodman; 1996:iv)

> එම නිසා Sex යන්න මගින් ජීව විද්‍යාත්මක වශයෙන් ස්ත්‍රී, පුරුෂ බව හඳුනාගත හැකි ය. Gender මගින් සමාජ විද්‍යාත්මකව ස්ත්‍රී පුරුෂ භේදය හා ලිංගික විවිධත්වය අර්ථ නිරූපණය වේ. ජීව විද්‍යාත්මක වශයෙන් ස්ත්‍රී/පුරුෂ ශාරීරික වෙනස්කම් ඇතිවන්නේ මව් කුස තුළ දීම ය. ස්ත්‍රියකට ස්ත්‍රී ශරීරය හා සම්බන්ධ ලක්‍ෂණ ද පුරුෂයෙකුට පුරුෂ ශරීරය හා සම්බන්ධ ලක්‍ෂණ ද පිහිටයි. "දරුවකු වශයෙන් මව් කුසින් බිහිවන නව ජීවිතය මුලින් ම ආරම්භ වන්නේ මවගේ ගර්භාෂය තුළ හට ගන්නා අල්පෙනෙති තුඩකට වඩා කුඩා වූ එකම සෛලයකිනි. මේ එකම සෛලය මව්කුසයෙහි ඉබේම නිර්මාණය වූවක් නොවේ. ශරීර දෙකක් ඇතුළත වර්ධනය වූ ආර්ථවානුවක් සහ ශුක්‍රාණුවක් ලිංගික සංසර්ගය මගින් සංයෝග වීමෙනි මේ සෛලය හට ගන්නේ. මේ ආරම්භක සෛලය ආර්ථවානුවකට සහ ශුක්‍රානුවකට වඩා හාත්පසින්ම වෙනස් වූ අලුත් නිර්මාණයකි. මේ සෛල 2, 4, 8 ක් ආදී වශයෙන් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වර්ධනය වී කළල රූපය හට ගනී. දරුවාගේ ඇට සැකිල්ල, මස්පිඩු, කායික අවයව හා ස්නායු පද්ධතිය හැඩ ගැසෙන්නේ මෙසේ අනවරතයෙන් වර්ධනය වන කෝටි සංඛ්‍යාත සෛල මගිනි." (සෝමතිලක; 1979:28)

"ස්ත්‍රීන්ට කෝමසෝම දෙකක් හා (XX) පුරුෂයින්ට X හා Y කියා ක්‍රෝමසෝම දෙකක් ඇත. Y ක්‍රෝමසෝමය ඇත්තේ පිරිමින්ට පමණක් නිසා එය ඉතා වැදගත් ය. පුරුෂ ක්‍රෝමසෝමය නිපදවනු ලබන්නේ තාත්තා විසිනි." (රත්නපාල; 2001:89) මේ අනුව කායික සහ මානසික වශයෙන් වෙනස් අනන්‍යතා ලක්‍ෂණ සහිතව ස්ත්‍රී - පුරුෂ දෙපාර්ශවය මව්කුස තුළ සිට ගොඩනැගෙන බව ප්‍රකට වේ.

> මුළු ශරීරය ම ප්‍රධාන වශයෙන් (1) ග්‍රාහක (2) කාරක (3) ස්නායු පද්ධතිය සහ (4) ග්‍රන්ථි යනුවෙන් කොටස් හතරකට බෙදිය හැකි ය. බාහිර ලෝකයේ අරමුණු සහ උත්තේජනය ග්‍රහණය කරන ඇස්, කන්, නාසාදී ඉඳුරන් ග්‍රාහක (Receptors) වශයෙන් ද ඒ ඒ අරමුණු ක්‍රියාත්මක කරන සහ ඒවාට ප්‍රතික්‍රියා කරන මාංශපේශීන් සහ අස්ථි පඤ්ජරය කාරක (Effectors) වශයෙන් ද ග්‍රාහක සහ කාරක යන දෙවර්ගය එකට සම්බන්ධ කරන සංවිධානය ස්නායු පද්ධතිය (Nervous System) විවිධ ශ්‍රාවයන් රුධිර මාර්ගයට වගුරුවන කොටස් ග්‍රන්ථි (Glands) වශයෙන් ද හැඳින්විය හැකි ය. (සෝමතිලක, 1979 : 31, 32)

ස්ත්‍රී පුරුෂ ශරීරය නිර්මාණයවීමේ දී යථෝක්ත සාධක පිහිටන අතර ඒවා කායික ව්‍යුහය හා මානසික ව්‍යුහය කෙරෙහි ප්‍රබල ලෙස බලපායි. ලිංගිකත්වය මෙන් ම සන්නිවේදනය සඳහා

ද මෙකී ලක්ෂණ හේතු වේ. මනුෂ්‍ය ශරීරය වනාහී දෙතිස් කුණපයෙන් සැදුනේ විය. එය දෙකෙල පනස්ලක්ෂයක් හිස කෙස්වලින්, නව අසූ දහසක් ලෝමයෙන්, විසි නියපොත්තෙන්, දෙතිස් දත්වලින්, මස් වසා සිටින සමින්, නවසියයක මස්පිඩුයෙන්, නවසියයක් නහරවැලින්, තුන්සියයක් ඇට සගුලින්, පුරා තිබෙන ඇට මිදුලෙන්, වකුගඩුයෙන්, හදමසින්, අක්මායෙන්, දළඹුයෙන්, බඩදිවින්, පපුකැනින්, දෙතිස් රියන් බඩවැලින්, අතුණුබහනින්, උදරයෙන්, අහර මලයෙන්, ඉස්මුලින්, පැතිර සිටින ලෙහෙයෙන්, සෝ දියෙන්, මේදස් තෙලින්, කඳුලෙන්, පිත් දියෙන්, යන මේ දැවලින් සම්ප්‍රයුක්ත වන්නේ ය. (ඥාණවිමල හිමි (සංස්), 1986 : 168)

බුදු දහමේ විවිධ තැන්වල ශරීරයේ පවත්නා විපරිණාම ධර්මතාව අනිත්‍යතාව විග්‍රහ කිරීමට මෙය භාවිත කළ ද එමගින් ශරීර නිර්මිතය පිළිබඳ කදිමට අවබෝධ කරගත හැකි වේ. මව් කුසෙන් පහළවන නව මානව ජීවියෙකුගේ මෙකී ශරීරාංග නිර්මාණය වී තිබීම දැකිය හැකි ය. ඒ අනුව ස්ත්‍රී පුරුෂ ලිංගිකත්වය තීරණය වී තිබීම ද විශේෂිත ය.

> ජීවිතය නිර්මාණය කිරීමටත්, ජීවියෙකුගේ ප්‍රාණය නිසි පරිදි පවත්වාගෙනයාමටත් අවශ්‍ය තොරතුරු ගබඩාවී ඇත්තේ ඩී. එන්. ඒ. යන කෙටි නමින් හැඳින්වෙන ඩියොක්සිරයිබෝ නියුක්ලික් ඇසිඩ් නම් අණුවෙහි ය. ඩී. එන්. ඒ. අණු ඇත්තේ වර්ණාංශවලය. ඩී. එන්. ඒ. අණුවක ජාන දසදහස් ගණනින් අඩංගුවෙයි. ජීවීන්ගේ ප්‍රවේණි ගති ලක්ෂණ පරම්පරාවෙන් පරම්පරාවට දායාද කරනු ලබන්නේ ජානවලිනි. (පරණගම, 2003 : 38)

> වර්ණාංශවල අඩංගු ජනකාණුවලට කිසියම් නියමිත කාර්යයක් ඉටු කිරීමට ඇත්තේය. ජනකාණු ක්‍රියා කරන්නේ සමූහ වශයෙනි. ඇතැම් ජනකාණු සමූහයක් මස් පිඬු ද තවත් ජනකාණු සමූහයක් ඇට කටු ද, වෙනත් ජනකාණු සමූහයක් ස්නායු පද්ධතිය ද ආදී වශයෙන් ශරීරයේ ඒ ඒ කොටස් නිර්මාණය කිරීමේ කාර්යය ඉටු කරන බව ජනකාණු විද්‍යාවෙන් ඉගැන්වේ. පුද්ගලයාගේ, ගතිගුණ, බුද්ධිය, පෞරුෂය, කාමරාගය ආදිය පිළිබඳ ප්‍රකෘති ලක්ෂණ හැඩ ගැස්වීම ද ජනකාණුවලට අයත් කාර්යකි. (සෝමතිලක, 1979 : 30)

ස්ත්‍රියක සහ පුරුෂයකු එක්වීමෙන් නිර්මාණය කළ නව ජීවියා මෙම පාර්ශව දෙකේ ම යම් යම් අනන්‍යතාවන් ද සහිතව එහෙත් ස්වීය ලක්ෂණයන් ද සහිතව ජන්මය ලබයි. එම ජීවියා මූලික වශයෙන් බාරගනු ලබන්නේ පවුල් ඒකකය විසිනි. එනම් සමාජයමවේ. එතැන් පටන් නවජයා පිරිමියෙක් නම් ඊට අදාළව ද ගැහැනියක් නම් ඊට අදාළව ද සමාජය විසින් පිළිගැනීමටත් ප්‍රතිචාර දැක්වීමටත් උත්සුකවේ. ලාංකික සමාජයේ පිරිමියෙක් නම් නිල් පැහැති ඇඳුම් පැළඳුම් හා උපකරණාදිය ද ගැහැනු දරුවෙක් නම් රෝස පැහැති ඇඳුම් පැළඳුම් ආදිය ද භාවිතයට ගනී. එයින් ස්ත්‍රීය හා පුරුෂයා සමාජ ජීවියා ලෙස අර්ථ නිරූපණය කරයි.

ස්ත්‍රී සහ පුරුෂ යන මූලික කායික ව්‍යුහය පමණක් සහිත මෙම මානව ජීවියා සාමජය විසින් බාර ගැනීමේදී නමත්, ජාතියත්, ආගමත් ආරෝපණය කරයි. ඒ අනුව ස්ත්‍රියක් නම් එකී සමාජයේ ස්ත්‍රීන්ට අදාළවන ගැලපෙන නම් ද පුරුෂයෙක් නම් ඊට අදාළවන යෝග්‍ය නම් ද ලබාදෙයි. ස්ත්‍රී - පුරුෂ සමාජභාවී ව්‍යවහාරය අනුව ලිංගභේදය (Gender) ක්‍රියාත්මක වීම ඇරඹෙන්නේ එලෙසිනි. මෙය බොහෝ සමාජවල දැකියහැකි ප්‍රායෝගික තත්ත්වයකි.

මේ සත්ත්වයන් අණ්ඩජ, ජලාබුජ, ඕපපාතික, සංසේජක ආදී වශයෙන් ආකාර කීපයකින් උපදින්නාහ. (ජිනරතන හිමි (සංස්), 1929 : 112) මනුෂ්‍යයෝ ද එමෙන් ම තිර්යග්ගකයෝ ද මෙකී චතුර් ආකාරයෙන්ම උත්පත්ති ලබත හැක්කාහු වෙති. කෙසේවුව ද උප්පත්ති ලබන්නා වූ සියලුම මනුෂ්‍යයෝ ඒකාකාරී නොවෙති. ඔවුන් වෙන්කොට දැක්වීම අසීරු කර්තව්‍යයක් වුව ද ප්‍රධාන වශයෙන් මනුෂ්‍යයන් කොටස් සතරක් කොට දැක්විය හැක්කේය. ඒ මනුෂ්‍ය නාරකිකයන්, මනුෂ්‍ය තිර්යග්ගනයන්, මනුෂ්‍ය ප්‍රේතයන් මනුෂ්‍ය භූතයන් යනුවෙන් වූ චතුර්විධ ආකාරයෙන් ය. ඒ මනුෂ්‍යයෝ ගති ලක්‍ෂණ වශයෙන් පංචවිධ වන්නෝය. නරක ගතිය, තිර්යග්ගගතිය, ප්‍රේතගතිය, මනුෂ්‍යගතිය, දිව්‍ය ගතිය යනු එකී මනුෂ්‍ය ලක්‍ෂණයෝ වෙති. (ජිනරතන හිමි (සංස්), 1929 : 112, 104, 117)

බෞද්ධ පිළිගැනීම අනුව උත්පත්තිය ලබන මිනිසා විවිධත්වයට ලක්වෙන ආකාරය පිළිබඳ මෙයින් විද්‍යමාන වෙයි. එහෙත් සමාජීය වශයෙන් මිනිසා වර්ගීකරණය වන විට ප්‍රධාන වශයෙන් ම ස්ත්‍රී පුරුෂ භේදය භාවිත කර ඇත. බෞද්ධ සමාජ සංවිධානය ලෙස පෙන්වා දෙන්නේ භික්ෂු භික්ෂුණී සහ උපාසක උපාසිකා වශයෙනි. මෙහි පවතින්නේ ස්ත්‍රී පුරුෂ භේදයයි. එය අනෙකුත් සමාජීය සාධකවලට වඩා ප්‍රමුඛ වන බැවිනි. ''මෙසේ මනුෂ්‍යයන් වෙතින් බෙදී යන ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂයෙන් මනුෂ්‍ය සංහතිය සමන්විත වී ඇත්තේය. එබැවින් එය ස්ත්‍රී පුරුෂ උභය ලෝකය ලෙස හැඳින් වේ. (ඤාණවිමල හිමි, 1986 : 554) ''ස්ත්‍රිහු ද පුරුෂයෝ ද ඔවුනොවුන්ගේ අනන්‍යතාව දක්වන්නා වූ දේහලක්‍ෂණවලින් යුක්ත ය. විසුද්ධිමාර්ගයේ දක්වන ආකාරයට පියොයුරු ආදී ස්ත්‍රී නිමිති ද දැළි රවුළු ආදී පුරුෂ නිමිති ද ඔවුනොවුන්ට ආවේණික ලෙස පිහිටා ඇත්තේ එබැවිනි.'' (වජිරඤාණ හිමි,1927 : 04) පුරුෂ ලිංගාදී හේතුත්ත්වය ලක්‍ෂණ කොට ඇත්තේ පුරුෂත්ව නමින් ද, ස්ත්‍රීන්ගේ අංග ජානය ස්ත්‍රී ලිංග නමින් ද වන බව අභිධර්මාර්ථ සංග්‍රහයේ දක්වා තිබේ. (ආනන්ද හිමි (සංස්), 1959 : 251)

ලිංගය (Sex) සහ ලිංගිකත්වය (Gender or Sexuality) යනු හුදෙක් වචන දෙකක් පමණක් නොවේ. එය සුවිශේෂිතව මානුෂ්‍ය වර්ගයාගේ ද, පොදුවේ සමස්ත සත්ත්ව සනතතියේම පමණක් නොව, ශාකමය ජීව පද්ධතියේ ද අනන්‍යතාව හා පැවැත්මට සම්බන්ධ ඉතාම සංකීර්ණ ක්‍රියාවලියකි. ලිංගිකත්වය හා ලිංගික සංසර්ගය පිළිබඳ ප්‍රතික්ෂේපිත මතවාද පළකරන ශාස්තෘවරු, මුනිවරු හෝ නික්ලේශී පුද්ගලයින්ට පවා යම් ලිංගික අනන්‍යතාවක්

පැවතුණි. ඔවුන් සියල්ලෝ ම අඹු - සැමි හෝ මව් - පිය වශයෙන් හඳුන්වන ස්ත්‍රී පුරුෂ සංයෝගයක ප්‍රතිඵලයක් ලෙස ජනිත වූහ. එසේ ම ඔවුන් ස්ත්‍රියකගේ හෝ පුරුෂයකුගේ වේශයෙන් පෙනී සිටිමින් ජීවන කටයුතුවල නියුක්ත වන්නාහ. එය ස්ත්‍රී - පුරුෂ සමාජභාවී ව්‍යවහාරයක්වේ. එනම් යම් සමාජයක ස්ත්‍රියකට හා පුරුෂයෙකුට සම්මතානුකූල හෝ නීත්‍යානුකූල පැවරීම් විය හැකි ය. නැතහොත් ජීව විද්‍යාත්මකව පැවරුණු කාර්යභාරයකට ස්ත්‍රී ශරීරය නිර්මාණය වී ඇත්තේ ස්ත්‍රියකට අදාළවන ජීව විද්‍යාත්මක කාර්යයන් සඳහා ය. දරුවන් දැරීම, දරුවන් වැදීම, කිරි එරීම, කිරි පෙවීමාදී කාර්යයන් පුරුෂයෙකුට සිදු කළ නොහැකි ය. එමෙන් ම පුරුෂයෙකුට අදාළවන කාර්යභාරයක් ද පවතී. එමෙන් ම සමාජ විද්‍යාත්මක වශයෙන් ද මෙකී පාර්ශව දෙකටම පැවරුණු තත්ත්වයන් හා කාර්යභාරයන් ඉටු කළ යුතු වේ. එය සමාජානුයෝජනයේ ද, සමාජ ඒකාබද්ධතාව හා සමාජ ප්‍රගමනයේ ද කාර්යභාරයක් බවට පත්වේ. ලිංගිකතාව විශ්වව්‍යාප්තිව පවත්නා බව ප්‍රකට කරුණකි. මොළයක් නැති බොහෝ ජීවීන්ට ද එය උරුමව පවතී. එහෙත් සපුෂ්ප ශාකවලට සහ යීස්ට් සෛලවලට ලිංගිකත්වයක් හෝ වින්දනයක් ලැබෙතැයි සිතිය නොහැකි ය. එසේ ම සියලුම සත්ත්වයින්ගේ ප්‍රජනනය සඳහා ලිංගිකතාව අවශ්‍යයැයි සිතිය නොහැකි ය. ඇමීබාවා නම් ඒක සෛලික ජීවියා න්‍යෂ්ටියකින් හා සෛල ප්ලාස්මයකින් යුක්ත වේ. මොවුන් බෝ වන්නේ දෙකට බෙදීමෙනි. එය ද්වී ඛණ්ඩනයක් (Binary Fission) ලෙස දක්වයි. මෙවැනි අලිංගික ජීවීන්ගේ බෝවීම වේගවත් ය. බැක්ටීරියාවක් යෝග්‍ය පරිසර තත්ත්වයක් යටතේ පැය අටක කාලයක් ඇතුළත මිලියන දහසයක් (16) දක්වා බෝවිය හැකි ය. (පරණගම, 2003 : 29-30) එනමුත් ලිංගිකත්වය මිහිමත වෙසෙන බොහෝ සතුන්ට ආවේණික ලක්ෂණයක් වේ. එය ඔවුනගේ ඉදිරි පැවැත්ම සඳහා අවශ්‍යවන බෝවීමේ ක්‍රියාවලියට අත්‍යවශ්‍ය වන බව ප්‍රකට කරුණකි.

> ''සන්නිවේදනය මනුෂ්‍ය සම්බන්ධතාවේ මූලාරම්භය යි. මවක් අත දරුවෙකුට කතා කළ විට දරුවාට කථා කිරීමට නොහැකි වුවත් ඔහු/ඇය සිනහවකින් හෝ අංගචලනයෙන් එයට පිළිතුරු දෙයි. ඒ තුළින් දෙදෙනා අතර සම්බන්ධතාවක් ඇතිවෙයි. ඒ මනුෂ්‍ය ස්වභාවයයි. මෙම සත්‍යතාව විවාහය තුළ දැකිය හැකි ය. පුරුෂයා හා ස්ත්‍රිය දෙදෙනෙකු ලෙස වෙනස් වුව ද වෙනස්කම් තුළ ජීවිතය ගෙනයෑමට නම් දෙදෙනා අතර අන්‍යෝන්‍ය තේරුම් ගැනීමත්, පිළිගැනීමත් අත්‍යවශ්‍ය හෙයිනි (ඇනට්මාරි (පරි), 2012 : 85).


මිනිසුන් මෙන් ම සත්ත්ව සන්තතිය අතර ද විවිධාකාර සම්බන්ධතා ගොඩනැගෙන්නේ සන්නිවේදනය මගිනි. මානව සමාජ සම්බන්ධතා ගොඩනැගීම, පුද්ගලාන්තර සම්බන්ධතා ඇති කිරීම ඇතුළු කුමනාකාර වූ හෝ සම්බන්ධතා ඇතිවන්නේ සන්නිවේදනය හේතුකොටගෙන ය. සම්බන්ධතා තර කිරීමට මෙන් ම ශක්තිමත් කිරීමට ඔවුනොවුන් අතර සන්නිවේදනයේ සාර්ථකත්වය බලපායි. එමෙන් ම සම්බන්ධතා ලිහිල් වීමට හෝ බිඳවැටීමට ද සන්නිවේදනය හේතුවේ. මානව සමාජගත සම්බන්ධතාවල මූලික

අවස්ථාවක් ලෙස ස්ත්‍රියක් සහ පුරුෂයෙක් අතර ඇතිවන්නා වූ ලිංගික සම්බන්ධතාව හඳුන්වාදිය හැකි ය. සෑම මානව සම්බන්ධතාවකටම ලිංගිකත්වය අදාළවේ. මන්ද යත් සම්බන්ධතාවන් ගොඩනැගෙන පාර්ශව දෙක කුමන හෝ ලිංගිකත්ව අනන්‍යතාවන්ට අදාළ වන බැවිනි. එකිනෙකා අතර ආකර්ෂණය, පදනම් කරගෙන සිදුවන්නාවූ සන්නිවේදනය හේතුකොට ගෙන ලිංගිකත්ව සම්බන්ධතා ගොඩනැගේ. මානව සමාජය ම එකම දාමයක් ලෙස ගොඩනැගීමට මෙකී ලිංගික සබඳතා හේතු වන බව ප්‍රකට වේ.

''නාහං භික්ඛවේ අඤ්ඤං ඒක රූපම්පි සමනුපස්සාමි යං ඒවං පරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවේ ඉත්ථී රූපං ඉත්ථී රූපං භික්ඛවේ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති... නාහං භික්ඛවේ අඤ්ඤං ඒක සද්දම්පි සමනුපස්සාමි යං ඒවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවේ ඉත්ථී සද්දෝ... නාහං භික්ඛවේ අඤ්ඤං ඒක ගන්ධම්පි සමනුපස්සාමි යං ඒවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිද භික්ඛවේ ඉත්ථී ගන්ධෝ... නාහං භික්ඛවේ අඤ්ඤං ඒකරසම්පි සමනුපස්සාමි යං ඒවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවේ ඉත්ථී රසෝ... නාහං භික්ඛවේ අඤ්ඤං ඒකපොට්ඨබ්බම්පි සමනුපස්සාමි යං ඒවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවේ ඉත්ථී පොට්ඨබ්බෝ.... (අංගුත්තර නිකාය 1, 1960 : 2-4)

ස්ත්‍රී රූපය තරම් පුරුෂයාගේ සිත් ඇද බැඳ ගන්නා වෙනත් රූපයක් ලොව නොමැත. ස්ත්‍රී ශබ්දය තරම් පුරුෂයාගේ සිත් ඇද බැඳ ගන්නා වෙනත් ශබ්දයක් ලොව නොමැත. ස්ත්‍රී ආඝ්‍රාණය තරම් පුරුෂයාගේ සිත් ඇද බැඳ ගන්නා වෙනත් ආඝ්‍රාණයක් ලොව නොමැත. ස්ත්‍රී රසය තරම් පුරුෂයාගේ සිත් ඇද බැඳගන්නා වෙනත් රසයක් ලොව නොමැත. ස්ත්‍රී ස්පර්ශය තරම් පුරුෂයාගේ සිත් ඇද බැඳ ගන්නා වෙනත් ස්පර්ශයක් ලොව නොමැත. මේ ආකාරයටම ස්ත්‍රියගේ ද සිත් ඇද බැඳ තබා ගන්නා ප්‍රධානම විෂය පුරුෂයා ලෙස විග්‍රහකර ඇත. පුරුෂ රූපය තරම්, පුරුෂ ශබ්දය තරම්, පුරුෂ ගන්ධය තරම්, පුරුෂ රසය තරම්, පුරුෂ ස්පර්ශය තරම් ස්ත්‍රියගේ සිත් ඇද බැඳ තබා ගන්නා වෙනත් කිසිදු වස්තුවක් විෂයයක් ලොව නොමැත. යනුවෙන් බෞද්ධ විග්‍රහය යි (අංගුත්තර නිකාය 1, 1960 : 2-5).

මෙහිදී ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පසිඳුරන්ට ගෝචරවන ආරම්මණයන් වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යනාදිය හේතු කොටගෙන ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර ඇතිවන්නා වූ ප්‍රබල, ශක්තිමත් සම්බන්ධතාවන් ගොඩනැගෙන බව ප්‍රකටවේ. ස්ත්‍රිය සහ පුරුෂයා අතර සන්නිවේදක, ග්‍රාහක සම්බන්ධතාවක් ලෙස යථෝක්ත සම්බන්ධතා ක්‍රියාවලිය සිදුවන ආකාරය පහත දක්වන ආකෘතියෙන් හඳුනාගත හැකි ය.





**ස්ත්‍රී/පුරුෂ සම්බන්ධතා ආකෘතිය**

මෙය මානව සමාජයේ සකලවිධ සම්බන්ධතා කෙරෙහි බලපාන ජීව විද්‍යාත්මක පදනමයි. පුරුෂ රූපය කරණකොටගෙන ස්ත්‍රිය උත්තේජනය වීමෙන් ස්ත්‍රිය විසින් පුරුෂයා වෙත ප්‍රතිචාර දැක්වීමත්,මත පදනම්ව ඔවුනොවුන් අතර සන්නිවේදන සම්බන්ධතා නිර්මාණය වේ. එමෙන් ම සන්නිවේදනය පිළිබඳ ජීව විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක පදනම් සහිත ආකෘතීන් ද ස්ත්‍රී/පුරුෂ සම්බන්ධතාවේ ස්වභාවය විග්‍රහ කිරීමට උපයුක්ත කරගත හැකි ය. ''මිනිසා සන්නිවේදක සත්ත්වයෙකි. එයට හේතුව ඔහු සතු සන්නිවේදන බලය අති මහත්වීම යි. ශබ්ද, රස, සංඥා, වචන, සිතුවිලි, ගඳ සුවඳ රස යනාදියෙන් සංදේශ හුවමාරු කර ගැනීමට ඔහු සමත් වේ. (ඇතුගල, 1998 : 10)

''සෑම සත්ත්වයෙකු ම තම ඉන්ද්‍රිය මගින් විවිධ උත්තේජන ලබයි. උත්තේජනයන් අභ්‍යන්තර උත්තේජන (Internal Stimulus) සහ බාහිර උත්තේජන (External Stimulus) යනුවෙන් ප්‍රභේද වේ. අභ්‍යන්තර උත්තේජන යනු ජීව විද්‍යාත්මක වුවමනාවන් ය. එනම් කෑම, බීම, විනෝදය, ලිංගික අවශ්‍යතා යනාදියයි. බාහිර උත්තේජනයන් යනු අවට සමාජයෙන්, ඉන්ද්‍රිය මුල් කොට ලබන්නා වූ උත්තේජනයන් ය. (ඇතුගල, 1998 : 30) ඒ අනුව ස්ත්‍රියක් තුළ හෝ පුරුෂයෙක් තුළ අභ්‍යන්තර වශයෙන් ඇතිවන්නා වූ ලිංගික සහජාසයන් හේතුකොට ගෙන උත්තේජන සහ ප්‍රතිචාර ජනිතවන අතර ඔවුනොවුන් අතර ඇතිවන්නා වූ සම්බන්ධතාවන් කෙරෙහි මේවා බලපායි.

ජෛවය පරිණාම ක්‍රියාවලිය මගින් උත්පන්න වූ ජීවීන් අතරින් මිනිසා වඩාත් ප්‍රබල ය. සුවිශේෂිත ය. ඔවුන් අතර පවත්නා ජීව විද්‍යාත්මක බෙදීම ස්ත්‍රී පුරුෂ ලිංගිකභාවය වේ. මානව පරපුර අඛණ්ඩව, අවියෝජනීයව පවත්වාගෙන යාමට ස්ත්‍රීන් හා පුරුෂයින් අතර ඇතිවන්නා වූ ජීව විද්‍යාත්මක බැඳීම අත්‍යවශ්‍ය වේ. ස්ත්‍රිය ඇයට ආවේණික වූ කායික හා මානසික ලක්ෂණයන්ගෙන් යුක්ත වේ. පුරුෂයා ද එසේ ම ය. ඔවුන් දෙදෙනා අතර සන්නිවේදනාත්මක සම්බන්ධතාවක් ක්‍රියාත්මක වීමේ දී ඔවුනොවුන් තමන්ගේ පෞරුෂත්වය,

ආකල්ප, විවිධ කුසලතා, අත්දැකීම් පරාසයන් ආදිය බලපාන බව පෙන්වා දෙයි. ඩේවිඩ් කේ. බර්ලෝ දක්වන ආකාරයට "සන්නිවේදන කුසලතා, ආකල්ප, ඥාන සම්භාරය, සමාජ පරිස්ථිතිය හා සංස්කෘතිය වැනි මූලාශ්‍රයමය සාධක, පාර්ශව දෙක කෙරෙහිම බලපායි." (දිසානායක, 1977 ፡ 59)




**ස්ත්‍රී/පුරුෂ සම්බන්ධතා පරාසය**

ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවේ දී ඔවුනොවුන් ස්වකීය අත්දැකීම් පරාසයන් ඔස්සේ ක්‍රියාත්මක වන විට සම්බන්ධතා පරාසයේ දී විවිධ සංදේශ හා සංඥා ක්‍රියාත්මක වේ. සම්බන්ධතා පරාසය අඩුවැඩි වන්නේ හෝ සාර්ථක අසාර්ථකභාවයට පත්වන්නේ ඔවුනොවුන් අතර හුවමාරුවන සංඥාර්ථ පද්ධතිය හේතුකොට ගෙන ය. ඔවුනොවුන්ට එකිනෙකා දැනෙන ප්‍රමාණය හා ස්වභාවය, අදහස්වල ගැලපීම, භාවාත්මක පසුබිම, ආකර්ෂණය, එකිනෙකා තේරුම්ගැනීම ආදී සියල්ලක් ම සංඥා සහ සංදේශ අනුව තීරණය වේ. මිනිසුන් වඩාත් දියුණුකරගත් අතිශය නිර්මාණශීලී සංඥාර්ථ පද්ධතියකින් ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ලෛංගික සන්නිවේදන සබඳතා ඇති කර ගැනීමට උත්සුක වේ. එහෙත් සියුම් සුපරීක්ෂාවකට ලක් කළහොත් සමස්ත ශාක සහ සත්ත්ව ජීව පද්ධතියට එක්තරා ආකාරයට විරුද්ධ ලිංගිකයන් අතර ආකර්ෂණීය සන්නිවේදන කාර්යයක් ඉටු කරන බව පැහැදිලි වේ.

> ''මල් මෙතරම් සුන්දර ඇයි ද යන්නට හේතුවක් තිබේ. මල් වර්ණවත් වීමෙන් එය ඝන වනාන්තරවලට ආකර්ෂණයක් ලබාදේ. සතුන් හා කෘමීන්ට ආහාරමය හා තමාගේ කොන්දේසි මල් පවසන්නේ, තමා පිළිබඳව වර්ණයන් මගින් සන්නිවේදනය කිරීමෙනි. මානවයා පවා මල් සුන්දර යැයි පිළිගැනේ. අපේ දිවි සුරකින පැලෑටි හා මල්වල වටිනාකම් තක්සේරු කිරීමට එමගින් තොරතුරු සැපයේ. මන්ද යම් පළතුරක් අමු ද, හොඳින් පැහී ඇත් ද, ඇඹුල් ද හෝ එය විෂ සහිත ද යන්න මිනිසාට වටහා ගැනීමට අවශ්‍යවේ. එය පවසන්නේ එහි වූ වර්ණයෙනි (ජයතුංග, 2003 ፡ 231).

බොහෝ සියුම් හෝ තේරුම් ගැනීමට නොහැකි සංඥාවන් සෑම පුද්ගලයෙකු විසින් නිකුත් කෙරේ. එය තමාට සවිමත් සහකරුවකු සොයා ගැනීමේ ආශාවක්

> අප තුළ ඇතිකරවන්නකි. එහෙයින් තමා විරුද්ධ ලිංගිකයන්ගේ අරමුණුවලට ගැළපෙන ආකාරයේ පුද්ගලයෙකු බවට සංකේතමය සංඥා නිකුත් කිරීමක් හා ලබා ගැනීමක් මිනිසා විසින් ද සිදුකෙරේ. පිරිමියෙකුට තමාගේ ආකර්ෂණීය බව ජීව විද්‍යාත්මකව වැදගත්වන්නේ එම ආකර්ෂණයට ගැහැනියක කදිම ප්‍රතිචාරයක් දක්වීමෙන් ඔහුගේ ජාන ඉදිරි පරම්පරාව වෙත ගෙනයාමට උපකාරීවීමෙනි (බාලසූරිය, 2012 : 231).

මෙම විමර්ශන මගින් ප්‍රකට වන්නේ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවක දී සංඥා, සංකේත හුවමාරුව මගින් සිදුවන්නා වූ සන්නිවේදනය අත්‍යවශ්‍ය වන බවයි. එය මානව සමාජයට පමණක් නොව ශාක හා සත්ත්ව ලෝකයේ පවා දකිය හැකි ස්වභාවයකි. ශාක ලෝකයේ බහුල වශයෙන් වර්ණවත් විවිධ පැහැයන්ගෙන් කෘමීන් කැඳවා ගැනීමට සංඥාවන් නිකුත් කරයි. ඒ මල් පරපුර හෙවත් ශාකවල ඉදිරි පැවැත්මට අදාළව ගැහැනු පිරිමි සබඳතා පැවැත්වීමට අදාළ පරාගන ක්‍රියාවලිය උදෙසාය. එය කෙතරම් අත්‍යවශ්‍ය වූවක් ද යත් එම කාර්යය සඳහා සහාය වන්නන් උදෙසා මල් පැණිවලින් ද සංග්‍රහ කරන අයුරින් ස්වභාව ධර්මය සංවිධානය වී ඇත. මෙය අතිශයින් විචිත්‍රවත් ආකර්ෂණීය ක්‍රියාවලියකි. ශාක ලෝකයේ සෞන්දර්යය, එහි චමත්කාරජනක බව වින්දනය කළ හැක්කේ මානවයාට පමණි. ඔවුන් පාරිසරික වෛචිත්‍රතාව විෂයෙහි දස දහස් ගණන් නිර්මාණ ගොඩනගා තිබෙන්නේ එකී වින්දනීය අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරමිනි.

ඒ අනුව, ස්ත්‍රී රූපයම, පුරුෂ රූපය ම සන්නිවේදනාර්ථ ප්‍රකට කරන පද්ධතියක් ලෙස ක්‍රියාත්මක විය හැකි ය. මේ ගැහැනියකි. මේ පිරිමියෙකි. යන වටහා ගැනීම මගින් ම එක්තරා සන්නිවේදනයක් සිදු වේ. එයම ස්ත්‍රියක් සහ පුරුෂයෙක් අතර සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමේ මූලික ප්‍රවේශයක් ලෙස දැක්විය හැකි ය. එය දෘෂ්ටිගෝචර සන්නිවේදනය (Visual Comiunication) මගින් සිදුවන දර්ශන ක්‍රමයක් විය හැකි ය. නැතිනම් අවාච්‍ය සන්නිවේදනය (Non-Comiunication) ඔස්සේ සිදුවන සම්බන්ධතා ආරාධනයක් විය හැකි ය. ඉත්ථි සංඥා, පුරුස සංඥා ලෙස මූල භාෂාවන්හි (පාලි-සංස්කෘත) විග්‍රහ වන්නේ මෙය යි.

> "ඉමස්මිං යේව බ්‍යාමමත්තේ කලේබරේ සසඤ්ඤිම්හි සමනකේ ලෝකඤ්ච පඤ්ඤාපේමි." "සංඥාවලින් හා විඤ්ඤාණයෙන් යුක්ත වූ බඹයක් පමණ නම් වූ මෙම ශරීරය තුළම ලෝකය පවත්නා බව මම දේශනා කරමි." (අංගුත්තර නිකාය 11, 1963 : 98)

> "චක්ඛුනෝ බෝ ආවුසෝ ලෝකස්මිං ලෝක සඤ්ඤිහෝති ලෝකමානි, සෝතේන බෝ ආවුසෝ ලෝකස්මිං ලෝක සඤ්ඤිහෝති ලෝකමානි, සානේන බෝ

> ................."ඇස ඇසුරු කරගෙන සංඥා උපදවයි, එතැන ලෝකය හටගනියි. කණ ඇසුරු කරගෙන සංඥාඋපදවයි. එතැන ලෝකය හටගනියි. මෙලෙස නාසය, දිව, ශරීරය හා මනස ඇසුරු කරගෙන සංඥා උපදවයි. එතැන ලෝකය හට ගනියි. (අංගුත්තර නිකාය 1, 1960:202)

ශරීර දෙකක් යනු සංඥා පද්ධතීන් දෙකකි. එහි සකලවිධ ලෝකය ම ඇතුළත් වන බවයි. එනම් සියලු සුඛ-දුක්ඛ සංවේදනාවන් ද ඉපදීම, පැවතීම හා නැතිවීමට අදාළ වන්නා වූ විශ්ව යථාර්ථය එහි ගැබ් වී ඇත. මෙම අධ්‍යයනය ස්ත්‍රී සහ පුරුෂ යන ප්‍රභේදයන්ට අයත් මානව පාර්ශව දෙකක් අතර සම්බන්ධතා ඇතිවීම කෙරෙහි බලපාන සන්නිවේදන සංඥා කෙරෙහි අවධානය යොමු කරන බැවින්, ඇස් කන් නාස් ආදී ඉන්ද්‍රිය හේතු කොට ගෙන ඇතිවන සංඥාවන් ද ඒ හේතුවෙන් ඇති වන විඤ්ඤාණය ද එකිනෙකා පිළිබඳ හැඟීම් දැනීම් අවබෝධයන්, ආශාවන්, පිනවීම්, වින්දනයන් හා තෘප්තීන් ඇති කර ගනී.

රූපාරම්මණ ⟹ චක්ඛු ⟹ චක්ඛු විඤ්ඤාණ
ශබ්දාරම්මණ ⟹ සෝත ⟹ සෝත විඤ්ඤාණ
ඝාණාරම්මණ ⟹ ඝාණ ⟹ ඝාණ විඤ්ඤාණ
රසාරම්මණ ⟹ ජිව්හා ⟹ ජිව්හා විඤ්ඤාණ
ඵස්සාරම්මණ ⟹ කාය ⟹ කාය විඤ්ඤාණ
ධම්මාරම්මණ ⟹ මන ⟹ මන විඤ්ඤාණ

සුඛ වේදනා
දුක්ඛ වේදනා

> "ඕනෑම මානව සම්බන්ධතාවක දී ක්‍රියාත්මක වන්නේ මෙකී මූලික පරමාර්ථමය සබඳතා ව්‍යුහය යි. එය මානව සන්නිවේදනයේ මෙන් ම සකලවිධ ජෛව ක්‍රියාවලියේ ම යථාර්ථය බවට පත්වීම නොවැලැක්විය හැකි ය. වේදනාව මෙන් සංඥාව ද, ඉන්ද්‍රිය සයට ගෝචරවන අරමුණු සය අනුව සවැදෑරුම් වෙයි. වේදනා සංඥා දෙකම හටගන්නේ ඉන්ද්‍රිය සය බාහිර ලෝකය සමඟ ස්පර්ශයට පැමිණීම නිසාය. කායික හෝ මානසික අරමුණු හඳුනා ගන්නේ සඥාව යි." (රාහුල හිමි, 1964:32)

වාචික, අවාචික, ශ්‍රව්‍ය, දෘශ්‍ය, ලිඛිත, අලිඛිත ආදී සන්නිවේදනයන් ක්‍රියාත්මක වන්නේ යථෝක්ත සංඥාවන් ඔස්සේ ය. පෙරදිග දර්ශනවාදයෙහි මෙය ඉතා ගැඹුරු විද්‍යාත්මක පැහැදිලි කිරීමක් වන බැවින් ද, ලිංගිකත්ව සම්බන්ධතාවට අදාළ මානව ක්‍රියාකාරකම් පිළිබඳ කරන අධ්‍යයනයක් බැවින් ද මෙම මූලාශ්‍රය මගින් නොමද අභාසයක් ලැබිය හැකි ය. එය පර්යේෂණ දිසානතිය කෙරෙහි යථාර්ථවත් ලෙස උපයුක්ත කර ගැනීමට හැකිවීම විශේෂ වශයෙන් වැදගත් වන බව අවධාරිත ය.

මිනිසාට දැනෙන ආශාවලින් ප්‍රබලතම ආශාව වන්නේ ලිංගික ආශාවයි. බොහෝ කාලයක් පුරා පරිණාමයට පත්වීම තුළින් ආදරය සමඟ ලිංගික ආශාව මිනිසාට ප්‍රබලව දැනේ. ආදරය හා ලිංගික ආශාව එකට බද්ධ වූ ආශාවන් නොවූවත් මිනිසා තුළ වූ ලිංගික ආශාව එක්වීමේ කැමැත්ත ආදරය සමඟ එකට ඇතිවන්නෙකි. නමුත් ආදරයෙන් තොරව ද ලිංගික ආශාව ඇතිවීම ස්වභාවික සංසිද්ධියකි. (කුරේ, 2011 : 18) ස්ත්‍රී, පුරුෂ ලිංගික ලිංගික සම්බන්ධතාව වනාහි ආදරය, ප්‍රේමය, ආලය වැනි මනෝ ආවේගවලට වඩා කාමරාගය හෙවත් රතිකාමය පදනම් කරගත් බව දක්වයි. කෙසේ වෙතත් ප්‍රේමය එකිනෙකා අතර ඇතිකර ගන්නා වූ විශ්වසනීය ආකර්ෂණ උපක්‍රමක්වේ. එය වාහකය බවට පත් කරගෙන ඔවුනොවුන් කාමය, රතිය හා සම්බන්ධ ලිංගික එක්වීමකට මාවත විවර කර ගනී. ඒ සඳහා ඔවුනොවුන් විසින් නිකුත් කරන නොයෙකුත් සන්නිවේදනාත්මක සංඥා ඉවහල් වේ.

මේ නිසා කාමය යනු ස්ත්‍රී පුරුෂ සබඳතාවන් සඳහා උපයෝගී වන බන්ධනකාරකයක් බවට පත් වේ. කාමය, ආශාව, තන්හාව පදනම් කරගත් මනෝ ආවේගයකි. ලිංගික ආස්වාදය නමැති සහජාසය සපුරා ගැනීමට ඉවහල්වන මනෝමය පෙළඹවීමකි. අථර්ව වේදයේ (14, 27, 71) ගීතයේ දැක්වෙන පරිදි ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාව අපූර්ව ලෙස අර්ථ නිරූපණය කර තිබේ.

''මම ඔබයි
ඔබ මමයි
මම ගීතය නම්
ඔබ පදවැලයි
මම අහසයි
ඔබ පොළවයි
පරපුර ගෙනයාමට
අප එසේ එකාවන්ව වෙසෙමු''

(බාලසූරිය, 2003 : 53)

''ස්ත්‍රී, පුරුෂ ප්‍රේමය ඔවුන් ඒකාත්මීය කරයි. එබඳු ඒකාත්මීය සබඳතාවකදී පුරුෂයා හෝ ස්ත්‍රිය තනිව ගත් කල අඩක් පමණි. ස්ත්‍රිය ස්ත්‍රියක වන්නේ පුරුෂයා නිසා ය. පුරුෂයා පුරුෂයෙකු වන්නේ ස්ත්‍රියක නිසාය. පුරුෂයාගෙන් වෙන්කරන ලද ස්ත්‍රිය අසම්පූර්ණ ය. ස්ත්‍රියගෙන් වෙන්කරන ලද පුරුෂයා අසම්පූර්ණ ය.''

ලොව පවතින්නේ ද පරපුර පවතින්නේ ද ස්ත්‍රී පුරුෂ සංසර්ගයෙනි. හින්දු ධර්මයෙහි ලෝක නිර්මාපක දෙවියා අර්ධ නාරිශ්වර ය. එනම් අඩක් ස්ත්‍රියකි.

> අනෙක් අඩ පුරුෂයෙකි. ස්ත්‍රී පුරුෂ සංයෝගය පූජනීය ලෙස ඔවුහු සැලකූහ. මිනිසෙකුට තම පතිනිය තමාගේ ම කොටසක් ලෙස දැකිය හැකිනම් ගීතයකින් පදවැල වෙන්කළ නොහැකිසේ එකිනෙකාගෙන් වෙන් කළ නොහැකි සේ දැකිය හැකි නම් එය ප්‍රේමය යි (බාලසූරිය, 2003 : 53).

වේද සාහිත්‍යයේ ස්ත්‍රී පුරුෂ සංයෝගය ප්‍රේමයෙන් පූජනීයත්වයට පත්වන ක්‍රියාවලියක් බවට පත් කරයි.

> ''ප්‍රේමයේ අරමුණ කුමක් ද? ප්‍රේමය නම් ප්‍රබලභාවය උපදින්නේ ජාන විසිනි. ජාන විසින් පරපුර අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. මිනිසා විසින් දූනට වසර පනස් ලක්ෂයක් තිස්සේ තම ජාන ඉදිරියට ගෙනවිත් තිබේ. ජාන ප්‍රජනන සහජාසාව උපදව යි. ප්‍රජනනය පමණක් ඊට ප්‍රමාණවත් නොවේ. ප්‍රජනනයෙන් උපදින දරුවන් සවිමත්ව වැඩෙන තුරු ඔවුන් සුරක්ෂිත පරිසරයක වසමින් පෝෂණය ලැබිය යුත්තේ ය. ඒ සඳහා පති පතිනියන් පොළඹවන්නේ ජාන විසිනි. ප්‍රේමය විසින් ස්ත්‍රී පුරුෂ දෙපොළක් සම්බන්ධ කරන ලද විට එයින් පවුල නමැති ඒ සුරක්ෂිත පරිසරය ගොඩනැගෙයි. පවුලේ පදනම පති පතිනි අන්‍යෝන්‍ය ප්‍රේමය යි. (බාලසූරිය, 2003 : 54)

එබැවින් ස්ත්‍රී පුරුෂ ලිංගික සබඳතාවට අදාළවන විද්‍යාත්මක ක්‍රියාවලියක් පවතී. එය කාමය, රතිය ආදී මනෝ ආවේග ලෙස ප්‍රකට වුව ද ස්ත්‍රී පුරුෂ ශරීරයන්හි සිදුවන විද්‍යුත් රසායනික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකි ය. බුදු දහමෙහි කාමය, රතිය, මෛථුන සේවනය පිළිබඳ ගැඹුරු දාර්ශනික විග්‍රහයක් ඉදිරිපත් වේ.

භාරතියානු සමාජ දර්ශනය සුඛය පරමාර්ථ කොටගත් බැවින් යථාර්ථ දෘෂ්ටීන් වැසීයාමට ඇති අවකාස වැඩි ය. මේ නිසා බෞද්ධ මූලාශ්‍රය ග්‍රන්ථවල කාමයේ වෛචිත්‍රතාවන් මෙන් ම ආදීනවයන් ද දක්වා තිබේ. එයට හේතුව භවගාමී ජීවිතයට සත්ත්වයා බැඳ තබන යදම කාමය, රාගය ඇසුරින් උපදින තන්හාව හෙවත් ආශාව වන බැවිනි.

> කැමැත්ත (Wish) ආශාව (Desire) සතුට (Pleasantness) සතුට ලබාදීම (Pleasure giving) ඉන්ද්‍රියන් පිනවීම (Sensual Enjoyment) ඉන්ද්‍රියන් පිනවීමට හේතු වන අරමුණු (An Object of Sensual Pleasure) යනාදී අරුත් රැසක් ''කාමය'' යන්න සඳහා ලබා දෙයි. (Pali English Dictionary, 1979 ; 203)

> කාමය යනු කැමැත්ත, ආශාව, ඇල්ම, සතුට, ඉන්ද්‍රිය පිනවීම යන කුමන අර්ථය වුව ද ස්ත්‍රී පුරුෂ සම්භෝගය සඳහා අත්‍යවශ්‍ය වූවකි. ''කාමය වනාහී විචිත්‍ර වූ, මිහිරි වූ, මනරම් වූ විවිධාකාර රූපයන්ගෙන් සිත් ඇළලීමට ලක් කරන බව''

''කාමාහි චිත්‍රා මධුරා මනෝරමා - විරූප රූපෙන මතෙන්ති චිත්තං'' යනුවෙන් දක්වයි. (මජ්ඣිම නිකාය 11, 1973 : 67)

''කාමීයන්තීති කාමා'' ''කාම යනු කැමැත්තවේ.'' (මහා නිද්දේශ අට්ඨකථා, 1921 : 43)

''තත්ථ ද්වේ කාමා, වත්ථු කාමාච කිලෙස කාමාච.... තත්ථ වත්ථු කාමා මනාප පිය රූපාදයෝ ධම්මා කිලෙස කාමා ඡන්දාදයෝ සබ්බේපි රාගප්ප භෙදා''

යනුවෙන් ''සුත්ත නිපාත අට්ඨකථාව'' දක්වන්නේ කාමය වස්තු කාමය හා ක්ලේශ කාමය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වන බවත්, මෙහි වස්තු කාමය යනු එම වස්තූන් කෙරෙහි ඇතිවන ඇල්ම, ආදරය, කැමැත්ත බවත් දක්වයි. (සුත්ත නිපාත අට්ඨකථාව, 1977 : 67)

ස්ත්‍රී පුරුෂ ලිංගික සබැඳියාව ''කාමය'' හේතුකොට ගෙන ඇතිවන බව මෙම මූලාශ්‍රය විග්‍රහයන් මගින් මනාව ගම්‍යමානවේ. එකිනෙකාගේ රූප, ශබ්දාදී සංවේදක ඉන්ද්‍රිය ආශ්‍රිත ආකර්ෂණීයත්වය මගින් ඇල්ම, ආදරය හා කැමැත්තත් ඇති වේ. එය ප්‍රබලතම සම්බන්ධතාවක් බවට පත් වේ. මෛථුනය හෙවත් සම්භෝගය සඳහා ස්ත්‍රී පුරුෂ දෙදෙනෙක් පොළඹවන බලවේගය, කාමය හෝ රතිය ලෙස දැක්විය හැකි ය. ''මිනිස් ආදරය සහ සෙනෙහස ද ඔහුගේ ලිංගිකත්වයේම අංශයකි. එය ද සම්පූර්ණයෙන්ම ලෞකික දෙයක් යැයි අපට කිව නොහැකි ය. මිනිසා ශාරීරිකව හා අධ්‍යාත්මිකව දෙකට බෙදීමට අපහසුව මෙන් ම මිනිස් ආදරය ද දෙකට බෙදිය නොහැකි ය. (ඇන්ටිමාරි, 2012 : 20)

ගැහැනු පිරිමි ලිංගික වශයෙන් එකිනෙකා කෙරෙහි ඇති කරගන්නා ආකර්ෂණයට හේතුවන්නේ ඔවුනොවුන් අතර පවත්නා ස්ත්‍රී පුරුෂ වෙනස්කම් ය. මේ අනුව ස්ත්‍රීන්ට පමණක් විශේෂ වූ ලැම පෙදෙස, සිහිනිග පුළුල් උකුල සුසිනිඳු මුහුණ ආදී ලක්ෂණ පිරිමින්ගේ සිත් ස්ත්‍රීන් කෙරෙහි ඇදීයාමට හේතුවන්නේ ය. (රණසිංහ, 2001 : 27)

එබැවින් ස්ත්‍රී පුරුෂ දෙදෙනෙක් අතර සබඳතාව කාමය රතිය වැනි, ඇල්ම, සතුට පිනවීම වැනි තත්ත්වයන් පදනම් කරගත්ත ද, ආදරය, සෙනෙහස, දයාව, කරුණාව වැනි සාධනීය චිත්තවේගයන් විසින් එයට අවශ්‍ය මානුෂීය ලක්ෂණ ඇතිකරගත හැකි ය. එය සත්ත්වයින්ට වඩා බුද්ධිමත්, නිර්මාණශීලී වින්දනයක් ලෙස දියුණු කර ගැනීමට මිනිසා සමත් වී ඇත.

ලිංගික වරණය (Sexual Selection) සඳහා මානව සමාජවල පිරිමින් සහ ගැහැනුන් සඳහා බලපාන කරුණු පිළිබඳ විවිධ අධ්‍යයනයන් මගින් තොරතුරු අනාවරණය වී ඇත. මානව සමාජ පරිණාමයත් සමග කලින් කලට එම සාධක වෙනස් කරගෙන ඇති බව පෙනේ. කාමය, රතිය, රාගය, ආශාව, තන්හාව යනාදිය ආගමානුකූලව මෙන් ම සමාජ මානව විද්‍යාත්මක විග්‍රහයන්වලදී ද අවධානය යොමු වූ බව ප්‍රකට වේ. විශේෂයෙන් චාර්ල්ස් ඩාවින් මානව පරිණාමය පිළිබඳ එතෙක් පැවති සියලු විද්‍යාවන්, ශාස්ත්‍රයන්, ධර්මතාවන් අභියෝගයට ලක් කිරීමට සමත්වන්නේ එහි පැවති පර්යේෂණාත්මක අනාවරණයන් නිසා ය.

> "ලිංගික වරණය මිනිසා කෙරෙහි බලපැවැත්වෙන ආකාරය ගැන අදහස් දැක්වූ ඩාවින් අප සහකරුවන් හෝ සහකාරියන් තෝරා ගැනීමේදී පියයුරු, කොණ්ඩය, නෙත්, සමේ පැහැය ආදී අඟ පසඟ කෙරෙහි ඕනෑවටත් වඩා අවධානය යොමු කරන බව සඳහන් කළේ ය. ඔහු පළකළ තවත් කරුණක් නම් ලොව නානා පෙදෙස්වල ජනයා මිනිස් සිරුරේ අඟ පසඟවල ප්‍රියංකර බව හෝ විරූපී බව ගැන තක්සේරු කරන්නේ ඔවුන්ගේ වටපිටාවෙන් ලැබුණු අත්දැකීම්වලට අනුකූලව ගොඩනගාගත් මිනුම් දඬු බව ය. මේ අනුව නවගිනියානු ජාතිකයෙකු නව ගිනියානු ගැහැනියකගේ හැඩරුව ද සික් ජාතිකයකු සික් ගැහැනියකගේ ප්‍රියංකර බව හෝ විරූපී බව ද තක්සේරු කරන්නේ ඔවුන්ගේ දෙමාපියන්, නෑසියන් අසල්වැසියන් හා අනෙකුත් මිනිසුන්ගේ හැඩරුවට අනුකූලව ය. එම තක්සේරුවලට අනුව විරූපී කාන්තාවකට හෝ විරූපී මිනිසකුට සහකාරයකු සොයා ගැනීම ලෙහෙසි නොවේ. (පරණගම, 2003 : 124)

ඒ අනුව ලස්සන, සුන්දරත්වය එකිනෙකා දිනා ගැනීමේදී ප්‍රමුඛ සාධකයක් ලෙස බලපායි. එහෙත් එය සමාජයෙන් සමාජයට, සංස්කෘතියෙන් සංස්කෘතියට සාපේක්ෂව වෙනස් විය හැකි ය. අප්‍රිකානු නීග්‍රෝ ජාතික පිරිමියකුට එකී ස්ත්‍රියක් සුන්දර ලෙස පෙනිය හැකි ය. එහෙත් ආසියානු හෝ වෙනත් රටක අයෙකුට එම සුන්දරත්වය නොපෙනිය හැකි ය. එහෙත් මෙය ද සර්ව සම්පූර්ණව පිළිගත නොහැකි වන්නේ ඇතැම්විට ඇමරිකාව, එංගලන්තය වැනි රටක සුදු ජාතික කතක් අප්‍රිකානු නීග්‍රෝ සම්භවයක් සහිත අයකු සමග එක්වීමට කැමති විය හැකි බැවිනි. ඒ ඔවුන්ගේ සිරුරේ පවත්නා හැඩි දැඩි ස්වභාවය, විශාල පුරුෂ ලිංගයන් සහිත බව යනාදිය නිසා වීමට පුළුවන. නමුත් විවිධ රටවල ස්ත්‍රීන් හා පුරුෂයන් සම්බන්ධවීමේ දී බොහෝ විට මෙතෙක් සාකච්ඡා කළ ස්ත්‍රීත්වයට හා පුරුෂත්වයට අදාළ කායික හා මානසික සාධකයන් මෙන් ම ඒ ආශ්‍රිතව සිදුවන සන්නිවේදන සංඥාර්ථයන් බලපාන බව ප්‍රකට වේ. එනම් ඔවුනොවුන් අතර සිදුවන්නා වූ සන්නිවේදනය යි. එම සන්නිවේදනය අන් සියලු ම සන්නිවේදනයන්ට වඩා ප්‍රමුඛ වන්නේ ජෛවීය ක්‍රියාවලිය හා සබැඳෙන හෙයිනි. කුමනාකාර මාධ්‍යයන් නිපදවාගත්ත ද ඒවා භාවිත කළ ද ලිංගිකත්ව සන්නිවේදනයට මූලික වන්නේ, ශාරීරික ඉන්ද්‍රීය ක්‍රියාකාරීත්වය, ස්නායු පද්ධතිය, මොළය යනාදිය යි. සමස්ත ශාරීරික ක්‍රියාකාරීත්වය ම එයට අදාළ වන බව ප්‍රකට කරුණකි.

මිනිසා සන්නිවේදන මාධ්‍ය නිපදවාගෙන ඇත්තේ සංවේදී ඉඳුරන් ආශ්‍රිත දැනවීමේ ගුණය ව්‍යාප්ත කිරීමට ය. ඒ අනුව ලිංගිකත්වය හා සම්බන්ධවන විවිධ කලාවන්, මාධ්‍යමය සාධක නිපදවා ඇති බව ප්‍රකට වේ. එහිලා වැදගත් වන විග්‍රහයක් වාත්ස්‍යායනගේ කාම සූත්‍රයෙහි දක්වා ඇත. වාත්ස්‍යායන සූසැට කාම කලාවක් දක්වයි. පුද්ගලයින් තුළ කාමය වඩවන කලාවක් හෙවත් වින්දන මාර්ග ලෙස මේවා දක්වා ඇති බව සිතිය හැකි ය.

> ගී සින්දු කීම, සංගීත භාණ්ඩ වැයීම, නැටීම - නාට්‍ය රංගනය, විවිධ වර්ණ සිතුවම් ඇඳීම, නලලත තිලක තැබීම, විවිධ පූජා සඳහා මාල සෑදීම, මල් යහනා සෑදීම, හම, දත්, ඇඳුම්, පැළඳුම් පාට කිරීම, ගෙබිම විවිධ වර්ණ මැණික් ඔබ්බවා සැරසීම, ඉතා සැපදායක නින්දකට ඇඳ සැකසීම, දියේදී බෙර ගසන්නාක් මෙන් දිය බෙර ගැසීම, ජල ක්‍රීඩා, සිතුවම් කලාවේ විවිධ ප්‍රයෝග ඉගෙනීම, මල් මාලා සෑදීම, මල් දමන කුඩ හා මල්වලින් හිස පළඳනා සෑදීම, කාලෝචිත ලෙස ඇඳුම් පැළඳුම් ඇන්දවීම, බෙලිකටු, ඇත්දත් භාවිතයෙන් කණට ආබරණ සෑදීම, ක්‍රමානුකූලව සුවඳ වර්ග ගැල්වීම, ආබරණ තෝරා බේරා ගැනීම, ඇස් රවටන විවිධ ප්‍රයෝග දැක්වීම, විවිධ උගතුන්ගේ උපදේශ ඉගෙනීම, කඩිසර හා හුරුබුහුටි බව, ඉවුම් පිහුම් දැනගැනීම, මැහුම් ගෙතුම් විවීම් ගැන ඉගෙනීම, ලණුවලින් කෙරෙන විවිධ ක්‍රියා, උඩැක්කි, වීණා වාදනය, තේරවිලි, තුන් තේරවිලි ගැන ඉගෙනීම, එලිවැට එලිසමය පිහිටුවා අක්ෂර මාරුකොට කවි සෑදීම, අසීරු කාව්‍ය බන්ධන වටහා ගැනීම, පාලක රජදරුවන් සතුටුවන පොත් කියවීම, රංගනය හෙවත් රඟපෑම, හිස්තැන් පුරවා කවි කීම, රටා පැදුරු විවීම, කැටයම් කර්මාන්තය හැදෑරීම, වඩු කර්මාන්තය හැදෑරීම, ගෙවල් තැනීම හා ගෙවල් පාලනය ඉගෙනීම, රත්තරන්, මැණික් ගැන අවබෝධය, ඛනිජ වර්ග හැඳිනීම, මැණික් විද්‍යාව දැන ගැනීම, ගෙවතුවගාව, ගහකොළ පාලනය හා සාත්තු කිරීම, කුකුළන්, එළුවන් වැනි සතුන් පොර කෙටීම, .ගිරා, මයින, සැළලිහිණි වැනි කුරුල්ලන්ට කතා පුරුදු කිරීම, ඇඟපත මිරිකීම, ඇතිල්ලීම, තෙල් ගැල්වීම, අක්ෂර වින්‍යාසය, විකල්ප අක්ෂර පාවිච්චි දැනුම, එක් එක් ප්‍රදේශවල භාෂාව දැනගැනීම, මල් සෑදීම, නිමිති ශාස්ත්‍රය ඉගෙනීම, රිය පැදවීම, ඉගෙනගත් ශිල්පය මතක තබා ගැනීම, කවි කටපාඩම් කිරීම, විවිධ විෂයන් ගැන යළි යළිත් මෙනෙහි කිරීම, කවි තැනීම, ග්‍රන්ථකරණය, ඡන්දස් ශාස්ත්‍රය දැනීම, විවිධ වෙස් ගැනීම, කවිවල හොඳ නරක විමසීම, ඇඳුම්වලින් අඟ පසඟ වැසීම, සූදු කෙළීම, පංච කෙළිය, ළදරුවන්ට අයත් සෙල්ලම් ගැන දැනගැනීම, ආචාරධර්ම ගැන දැන ගැනීම, යුද්ධ කටයුතු ගැන දැන ගැනීම, ශාරීරික ව්‍යායාම ගැන දැන ගැනීම වේ. (මුදියන්සේ (පරි), 1999 ፡ 16-18)

වාත්ස්‍යායන කාම සූත්‍රය රචනා කරන්නේ ස්ත්‍රී පුරුෂ සම්භෝගයේ විවිධාකාර වූ පැති පිළිබඳව විවරණය කිරීමට ය. එය හුදෙක් න්‍යාය ශාස්ත්‍රයක් පමණක් නොව ප්‍රායෝගික

ජීවිතයේ රස වින්දනය උදෙසා ප්‍රබල මානව විද්‍යාත්මක පදනමක් සහිතව රචනා කරන්නක් බව පැහැදිලි වේ.

ස්ත්‍රීන් සහ පුරුෂයන් එකිනෙකා දිනා ගැනීමේ කලාව කාම කලාවක් වේ. ඔවුනොවුන් කෙරෙහි කැමැත්තක්, ආශාවක් ඇතිකරන ශාස්ත්‍රයක් ලෙස මේවා හඳුන්වා දිය හැකි ය. යම් පුද්ගලයෙක් (ස්ත්‍රී, පුරුෂ) තම ජීවිතයේ ලිංගිකත්වයෙන් පමණක් නොව අනෙකුත් සියලු ම අවශ්‍යතාවන්ගෙන් සාර්ථකත්වයට පත් කර ගැනීමේදී වාත්ස්‍යායන දක්වන ක්ෂේත්‍රවල යම් නිපුණතාවක් තිබීම වැදගත් වේ. මේ සූසැට කාම කලාවන් සියල්ල කෙරෙහි ම නොවුණ ද යම් ප්‍රමාණයක් පිළිබඳ දැනීම සාමාන්‍ය පුහුදුන් ජීවිතය සාර්ථක ලෙස ගත කිරීමට අත්‍යවශ්‍ය වේ. සූප ශාස්ත්‍ර හෙවත් ආහාර පිසීමේ කලාව ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ප්‍රගුණ කර ඇත්නම් එය ඔවුන්ගේ ජීවිත සාර්ථක වීමට බලපායි. එසේ ම ශරීරාලංකරණ කලාවන් වේශ භූෂණ ක්‍රමවේදයන් ද එසේ ම ය. නිවාස ඉදිකිරීම එම නිවෙස්වලට අවශ්‍ය ගෘහ භාණ්ඩ ඇතුළු අනෙකුත් උපකරණ සැකසීම මානව ජීවිතයේ රසවත් වින්දනය කෙරෙහි බලපායි. විවිධ ව්‍යායාම, ක්‍රීඩා ආදිය මගින් කායික සුවතාව හා මානසික විශ්‍රාන්තිය ඇතිවේ. සාහිත්‍ය, සංගීත, නර්තන, නාට්‍ය, චිත්‍ර කලා, කැටයම් කලා, ආදී සාහිත්‍ය කලා නිර්මාණ විෂයෙහි මිනිසා දක්වන ප්‍රාගුණ්‍යතාවන් ආනන්දයත්, ප්‍රඥාවත් මිනිසා වෙත සාක්ෂාත් කරයි. එය මානව ජීවිතයේ උත්කෘෂ්ටාස්වාදය පිණිසම හේතු වේ. භාවමය හා බුද්ධිමය වශයෙන් ජීවන වපසරිය වර්ධනය කර ගැනීම පුහුදුන් ජීවිතයේ ජයග්‍රහණයක් බවට පත්වීම නොවැලැක්විය හැක්කකි. ප්‍රායෝගික ලෝකය දෙස විමර්ශනාක්ෂියෙන් අවලෝකනය කරන විට මෙය මනාව විශද වේ. කලාව සෞන්දර්යාදී විෂයයන් කෙරෙහි නැඹුරුතාවක් අතර මෙන් ම අන්‍ය ජනසමාජාකාර්ෂණය ද උසස් මට්ටමක පවතී. මානව ශිෂ්ටාචාරය ද ඉතිහාසය ද වර්ණවත් භාවයට පත් කිරීමේ දී ඔවුන්ගෙන් සිදුවූ කාර්යභාරය සුළු පටු නොවේ. එපමණක් නොව පාලනක්‍රම, යුධ කටයුතු ආචාරධර්ම, නීතිකෘත්‍යාදිය ද කාම කලාවටම අයත් වේ.

කාමයෙහි ආදීනව ලෙස දෙආකාර වූ විග්‍රහයන්ගෙන් පෙරදිග සමාජය පොහොසත් ය. උපරිම සැපදායක කාමභෝගී ජීවිතයකට අවශ්‍ය කාම කලාවක් පිළිබඳ වාත්ස්‍යායන අවධානය යොමු කරන විට ඉන්පෙර ගෞතම බුදුන් වහන්සේ කාම වාසය සංසාරික ජීවිතයට මිනිසා බැඳ තබන බවත් එයින් අත් මිදීම ආත්ම විමුක්තිය ලඟා කරගැනීමෙහිලා බෙහෙවින් වැදගත්වන බවත් පෙන්වා දෙයි. එනම් කාමය ආශාවටත් තණ්හාවටත් හේතුවන අතර එහි ආදීනතාවක් ලෙස මිනිසා වියෝ දුකට, හෙවත් අත්හැරයාමට නොහැකි නිසා ඇතිවන දුකට පත්වන බවත් දක්වා ඇත. බුදුන් වහන්සේට එය එසේ විග්‍රහ කිරීමට සිදුවන්නේ තත්කාලීන භාරතියානු සමාජයේ පැවතියා වූ කාමභෝගී ජීවිතවල යථාර්ථය පෙන්වාදීමට තිබූ අවශ්‍ය නිසා විය හැකි ය. එතුමන් වසර 29ක් මුළුල්ලේ හැදී වැඩුණු උග්‍ර කාමභෝගී ජීවන රටාව ඇතුළත, එහි සුඛ පරමාර්ථ පාර්ශවය පමණක් මතුවී පෙනුණි. එහෙත් කාමුක ජීවිතයේ අනෙක් පාර්ශවයෙහි පවත්නා දුක්ඛිත භාවය, පීඩාකාරී භාවය, වෙහෙසකර

ස්වභාවය ද පෙන්වා දීමට සිදුවිය. එබැවින් මෙහි පවත්නා තාවකාලික ස්වභාවය පිළිබඳ අනිත්‍ය ප්‍රතිසංයුක්තතා ධර්මානුධර්ම විග්‍රහයක් සිදු කෙරේ. එහි ද කාමය පිළිබඳ යම් ගැඹුරු විශ්ලේෂණයක් පවත්නා බව ප්‍රකට වේ.

''තත්ථ ද්වේ කාමා, වත්ථ කාමාච, ක්ලේස කාමාච'' (සුත්ත නිපාත අට්ඨකතා, 1977 : 67) යනුවෙන් දක්වන වස්තුකාමය හා ක්ලේශ කාමය යන පාර්ශව දෙක ආශ්‍රිත විග්‍රහයන් වාත්ස්‍යායන ඉදිරිපත් කරන කාම කලාවේ යම් යම් අංග සමග ගැලපෙන බව ප්‍රකට වේ. වස්තුකාම හා ක්ලේස කාම පිළිබඳව **මහා නිද්දේසපාළියෙහි** සවිස්තරාත්මකව දක්වා ඇත.

> ''කතමේ වත්ථු කාමා, මනාපිකා රූපා, මනාපිකා සද්ද, මනාපිකා ගන්ධා, මනාපිකා රසා, මනාපිකා පොට්ඨබ්බා, ආබරණා දාසිදාසා, අජේලකා කුක්කුම සූකරා, හත්ථි ගවාසය වළවා ඛෙත්ත වත්ථු, හිරඤ්ඤ සුවණ්ණං ගාම නිගම රාජධානියෝ රට්ඨංච ජනපදොච, කොසොච, කෝට්ඨාගාරෝච, යං කිඤ්චි රාජධානියං වත්ථු, වත්ථුකාමා'' (මහා නිද්දේසපාළිය, 1961 : 2-3)

වස්තු කාමයෝ කවරේද යත්, සිත් වඩන රූපය, ශබ්දය, ගඳ සුවඳය, රසය, ස්පර්ශයන් ය. එමෙන් ම ඇතිරිලි, පොරෝන, දසී දසුන් එළු බැටළුවන්, ඌරන්, කුකුළන්, ඇත් අස් ගව වෙළඹුන්, කෙත්වතු කහවනු සහ රත්‍රං ගම් නියම් ගම් රාජධානි, රටවල්, ජනපද පෙට්ටගම් (අල්මාරි වැනි) ගබඩා යනාදී වශයෙන් ඇලුම් කෙරෙන වස්තූන් සියල්ල මිනිසා පසිඳුරන් පිණවීම කෙරෙහි පවතින්නේ ය. වාත්ස්‍යායන කාම කලාවන්ට සම්බන්ධ කර දක්වන්නේ ද පුද්ගලයා පිණවීමට යොදා ගන්නා මෙකී අංගෝපාංග බව ප්‍රකට වේ. මීට අමතරව මහා නින්දේස පාළියෙහි වස්තුකාමය තවදුරටත් විග්‍රහ කොට දක්වා ඇත.

> ''අපිච අතීත කාමා, අනාගත කාමා, පච්චුප්පන්න කාමා,හීනා කාමා, මජ්ඣිමා කාමා, පණීතා කාමා, අපායිතා කාමා, මානුසිකා කාමා, පච්චුපට්ඨිතා කාමා, නිම්මිතා කාමා, පරනිම්මිතා කාමා, අනිම්මිතා කාමා, සබ්බේපි කාමාවචරා ධම්මා, සබ්බේපි රූපාවචරා ධම්මා සබ්බේපි අරූපා වචරා ධම්මා, තණ්හා වත්ථුකා, තණ්හාරම්මණා, කමනීයට්ඨෙන, රජනීයට්ඨෙන, මදනීයට්ඨෙන, කාමා, ඉටේවුච්චන්ති වත්ථු කාමා'' (මහානිද්දේසපාළිය, 1961 : 2-4)

තව ද අතීත අනාගත වර්තමාන කාමයෝ ය. ආධ්‍යාත්මික හා බාහිර කාමයන් ය, හීන මධ්‍යම හා ප්‍රණීත කාමයන් ය. සතර අපාය, මිනිස් ලොව හා සදෙව්ලොව කාමයන් ය. එළඹ සිටි කාමයන් ය. නිර්මිත පරිනිර්මිත හා අනිර්මිත කාමයන් ය. මගේ යැයි පිළිගත් සහ නොපිළිගත් කාමයන්ය. තණ්හා වශයෙන් පිළිගත් නොපිළිගත් කාමයන් ය. කාමාවචර, රූපාවචර හා අරූපාවචර ධර්මයන් වශයෙන් තෘෂ්ණාවට හේතු වූ, අරමුණු වූ ඇලීමට බැඳීමට යෝග්‍ය වන අර්ථයෙන් කුලමදය වැනි මදයන් ඉපදවීම අදාළ කාමයන් ය. මේ

සියල්ල වස්තු කාමයෝ වෙති. මෙය ඉතාම සියුම් දාර්ශනික තලයක පවත්නා විග්‍රහයකි. සරලව පෙනෙන බන්ධනයන් මෙන් ම එයින් ඔබ්බට පවත්නා වූ මනුෂ්‍ය දිව්‍යාදී සකලවිධ ජීව ලෝකවල ඇලීම, බැඳීම කෙරෙහි මූලිකවන්නා වූ සාධක සියල්ලක්ම කාමයන් ලෙස දක්වා ඇත. ස්ත්‍රී පුරුෂ බන්ධනය කරවගන්නේ, එයට හේතුවන සියල්ල කාමය යන්නෙන් විග්‍රහ කෙරේ. එකී බන්ධනයන් සියල්ලම සන්නිවේදනය ඇසුරින් සිදුවන්නකි. බෞද්ධ විග්‍රහයේ එන වස්තුකාමය මෙන් ම ක්ලේස කාමය ද ප්‍රධාන වේ. එනම් වස්තුකාමයන් අරමුණු කොට මානව චිත්ත සන්තානයන්හි ඇතිවන ක්ලේසයන් ය. ආශා ප්‍රමුඛ කොටගත් හැඟීම්ය, චිත්තවේගයන් ය.

''කතමේ ක්ලේස කාමා, ඡන්දෝ කාමෝ, රාගෝ කාමෝ, ඡන්දරාගෝ කාමෝ, යෝ කාමේස කාමච්ඡන්දා, කාම රාගෝ, කාම නන්දි, කාම තණ්හා, කාම සිනේහෝ, කාම පරිලාහෝ, කාම මුච්ඡා, කාමජ්ඣෝසානං, කාමෝහෝ, කාමයොගෝ, කාමූපදානං කාමච්ඡන්ද නීවරණං.... ඉමේ වුච්චන්ති කිලෙස කාමා'' (මහානිද්දේස පාළිය, 1961 : 2-3)

ක්ලේස කාම කවරේ ද? යත්, රාගික ප්‍රලෝභනය, පෙළඹුණු රාගය, රාගික සිතුවිලි හා සිතුවිලි රාගය, කාමය කෙරෙහි ඇති කැමැත්ත, කාම රාගය, කාම සතුට, කාමාව, කාම ආදරය, කාම දූවිල්ල, කාම මුලාව, කාම ඕඝය, කාම යෝගය, කාමයෙහි ඇලීම ආදිය ක්ලේස කාමවේ. මේ ලෝකයේ ඇති වස්තුන් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශාදී ලෙස වස්තුකාම ස්වරූපයෙන් පවත්නා අතර මිනිසා සිය මනසින් ඇති කරගන්නා ඇල්මෙන් ආශාවෙන් බැඳීමෙන් ඒවා සමීප කර ගැනීමට, තමාගේ කර ගැනීමට පිනවීමට අදාළ වන්නාවූ ක්ලේස කාමමනෝභාවයෝ උත්පන්න කරගන්නාහ. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයකගේ බැඳීම සඳහා මෙකී වස්තුකාම හා ක්ලේස කාම හේතුවේ. කාම බන්ධනය තාවකාලික වින්දනයක් සේ පෙනුන ද එය බොහෝ වූ දුකට හේතුවන බව බුදු දහමේ විනිශ්චය යි. එය විවිධ වූ උපමාවන්ගෙන් පැහැදිලි කර පෙන්වීමට උත්සුකවී ඇත. ''කාමයෝ ඇට සැකිල්ලක් වැනිය, මස් වැදල්ලක් සේයා කණුගලක් බඳු ය. ගිණි අඟුරුවලක් මෙනි. නානා විචිත්‍ර සිහිනයක් සේය. පිරුළක් සේය. රුක් එල වැනි ය. අසිපත හා මස් ලොඹුවක් සේය. අඩයටි හුලක් සේ ය. සර්ප හිසක් වැනිය.'' (මජ්ඣිම නිකා ය - 1, 1964 : 330)

කාමය සඵල කර ගැනීම සඳහා මිනිස්සු විවිධ වෙහෙසකර ජීවන වෘත්තීන්හි නිරතවෙති. නොයෙකුත් සඵල නොවන උත්සාහයන්හි පවා නිරත වන්නාහ. නොයෙකුත් භවභෝගාදිය ද ගේ දොර ආදිය ද ආරක්ෂා කිරීමට යොමුවෙති. විවාද හා කලහයක් ඇති කරගනී. යුද්ධ කිරීම් හා ආක්‍රමණයන් සිදු කරයි. සිත,

කය, වචනයෙන් දුෂ්චරිත ක්‍රියාවන්හි නිරතවෙති. මේවැනි වූ ක්‍රියාවන් කාමය සඳහා සිදුකරන දුක්ඛිත වෙහෙසකර දේ ලෙස මජ්ඣිම නිකායේ මනාලෙස විශ්ලේෂණය කර ඇත. වාත්ස්‍යායන කාමභෝගී ජීවිතයෙන් ජීවිතය නතර කරන නිසා ඒවා නොයෙකුත් කලාවන් එනම් කාමය දිනාගැනීම හා ලඟා කර ගැනීම සඳහා වන උපාය මාර්ගික භාවිතයන් ලෙස පෙන්වා දී ඇත. කාම සූත්‍රයෙහි ආරම්භයේදීම දක්වන්නේ ''අවුරුදු සීයක් ආයු ඇති පුරුෂයා ඒ ආයු කාලය මනාසේ බෙදාගෙන එකිනෙකට බැඳී පවත්නා අර්ථ, ධර්ම හා කාම යන ත්‍රි වර්ග සම්පත එකක් අනෙකකින් නොනැසෙන පරිදි සේවනය කළ යුතුය...... බාල කාලයෙහි ඉගෙනීම කළ යුතුය. තුරුණු වියෙහි හා මැදියම් වියෙහි අර්ථ (ධන) සම්පාදනයකින් කාම සේවනයෙහිත් යෙදිය යුතුය. මහලු කාලයෙහි ධර්මය හා මෝක්ෂය (සසරින් ගැලවීම) සේවනය කළ යුතු ය. (යාපා, 1997 ඃ 9)

ඒ අනුව අර්ථ ධර්ම, කාම මෝක්ෂ යන සිව් සම්පත්තීන් අතරින් මුල් ත්‍රිවර්ගය ද එයින් ද කාම සම්පත්තිය පිළිබඳ වඩාත් අවධානය යොමුකර ඇත. ඔහු එසේ සිදු කිරීමේ දී පරඹුවන්, පරපුරුෂයන්, ගණිකාවන් සේවනය ආදිය පිළිබඳ දක්වා ඇතත්, මොහු සමාධිගත සංයමය සහිත පුද්ගලයෙක් බව පෙන්වා දෙයි.

''තදේතද් බ්‍රහ්මචර්යේණ

පරේනච සමාධිනා

විහිතං ලෝකයාත්‍රායෙ

න රාගාර්ථොස්‍ය සංවිධි''

බ්‍රහ්මචර්යාවෙන් හා ස්ථිරසාර සමාධියෙන් යුක්ත වාත්ස්‍යායන මෙය සම්පාදනය කළේ ලෝක යාත්‍රාව සඳහාය. රාගය ඇවිස්සීම පිණිස නොවේ. (යාපා, 1997 ඃ 4)

ලෝක යාත්‍රාව නම් ලෝකය ඉදිරියට ගෙනයාම ය. එනම් මානව වර්ගයා ප්‍රමුඛ සත්ත්වයා ය. එයින් මෙයට අදාළ වන්නේ මිනිසා ය. මිනිස් වර්ගයා ඉදිරියට ගෙනයාම යනු ස්ත්‍රී පුරුෂ සම්භෝගයෙන් මානව ජාන සම්පත පවත්වාගෙන යාම ය. වර්ගයා බෝකිරීම වේ. දරුවන් සෑදීමයි. එය සතුන්ට මෙන් කළ නොහැක්කකි. ශිෂ්ට සමාජගත මිනිසා ඒක භාර්යාව්‍රත, ඒක පුරුෂ ව්‍රතවලට පිවිසීමත්, පවුල් ඒකකයත් තුළට අන්තර්ග්‍රහණය වී දරුවන් වැදීම, පෝෂණය කිරීම, ආරක්ෂණය හා සමාජානුයෝජනය වැනි වූ බොහෝ කෘත්‍යයන් ඉටු කරනු ලබති. එබැවින් වාත්ස්‍යායනගේ පරමාර්ථය ලෝක යාත්‍රාව පිණිස නම් ඒ සඳහා ශක්තිමත් පවුල් කුටුම්භ සංරක්ෂණයක් සඳහා වූ පෙළඹවීමක් විය යුතුය. එහිදී බොහෝකොටම ස්ත්‍රීන් සහ පුරුෂයින් කාම සම්භෝගයේ දී උපරිම වින්දනයක් ලබා ගැනීම සඳහා වන උපදේශයන් කාම සූත්‍රයෙන් ලබා දීමට උත්සාහ දරයි. එහෙත් හොඳ ගණිකාවන් කරා යාම, අන් ස්ත්‍රීන්

සේවනය කිරීම වැනි ක්‍රියාවන් සඳහා මග පෙන්වීමක් කරන්නේ තත්කාලීන ප්‍රභූවාදී පවුල්වල පැවති පුරුෂාධිපත්‍යධාරී පිළිගැනීම් අනුව විය හැකි ය. ගණිකා වෘත්තිය භාරතීය සමාජයේ අනුදත් ක්‍රමවේදයක් වන අතර විශේෂයෙන් රජුන් අන්තඃපුර පවත්වාගෙන යමින් බහුභාර්ය සේවනය සාධාරණීකරගෙන තිබූ බවත්, හැකිතාක් එම කාන්තාවන් තෘප්තිමත් කිරීමත්, තම ජාන සම්පත වැඩි වැඩියෙන් බෝකිරීමත් සිදුවී ඇත. එම ක්‍රියාවලිය අනුමත කරමින්, එවැනි කාමභෝගීන්ගේ ජීවිත වඩාත් වින්දනීයත්වයට, ආශ්වාදයට පත් කිරීම සඳහා කාම සූත්‍රයෙන් උපදෙස් ලබා දුන්නා විය හැකි ය. ''රාගය ඇවිස්සීම සඳහා නොවේ'' යන්න ද ඔහුගේ උපදේශනයන් සමඟ පරස්පර වේ. එයට හේතුව කෘතිය පුරාම පවතින්නේ රාගය අවධිවනතුරු කාමුකත්වය උද්දීපනය වන ආකාරයට සිදු කරන මග පෙන්වීම් ය. එය පුහුදුන් මිනිසාගේ අවශ්‍යතාව යි. ඇවිස්සුණු රාගයෙන් ලිංගිකත්වයේ පාලනයෙන් තොර අමානුෂික ලක්ෂණ මතුවිය හැකි ය. මෙය වුව ද මනා ශික්ෂණයකින් හා සංයමයකින් යුක්තව ඉටු කළ යුතු බව වාත්ස්‍යායන පෙන්වා දෙනවා විය හැකි ය. එසේ ම වාත්ස්‍යායන බෞද්ධ සූත්‍ර දේශනාවල එන කාමය, රාගය, මෛථුන සේවනය හා ඒවායෙහි ආදීනව කියවා එයින් පෝෂිතව, ලෞකික මිනිසුන්ගේ සුඛාස්වාදය පිණිස මග පෙන්වීමට කාම සූත්‍රය වැනි කෘතියක් රචනා කළා විය හැකි ය.

ලිංගික කාමය හේතු කොටගෙන මෙවුන්දම් සේවනය හෙවත් සංසර්ගයෙහි යෙදෙන ස්ත්‍රී පුරුෂ දෙදෙනෙක් නිසා ම මිනිසා ජනිත වේ. ඒ සඳහා ද ලිංගික කාමයෙන් යුක්ත වන බව සරල තර්කයකි. එබැවින් ලිංගික කාමය මිනිසාගේ කායික අවශ්‍යතාවක් බවට ද පත් ව තිබේ. සමාජයේ සකලවිධ වටිනාකම් හා ඇගයීම් පද්ධති, ආචාරධර්ම, සාරධර්ම, නීති, සමාජ සම්බන්ධතා ව්‍යුහ ආදී සියල්ලක් කෙරෙහිම ලිංගිකත්ව සාධකය බලපාන බව ප්‍රකට කරුණකි. මේ නිසා ලිංගික කාමය සඳහා යම් යම් ප්‍රමිතීන් සීමාවන් පාලනයන් ප්‍රතිපත්තිමය සම්මතයන් ආදිය ඉදිරිපත්ව තිබේ. කෙසේ වුවත් මානව ලිංගික සබඳතාවලට විවිධ සීමාවන් පැනවීම එය සත්ත්වයින්ගේ සීමාවට නොගොස් මානවත්වයේ උසස්භාවයන් රැක ගැනීමට ඉවහල් වී ඇත. නැතහොත් සතුන් හා මිනිසුන් අතර වෙනසක් නොවනු ඇත. සත්ත්වයින්ට සොබාදහම මෙන් ම මේ සඳහා පාලනයක්, සීමාවක් දී ඇත. මිනිසුන් එය තම චින්තනය බුද්ධිය උපයෝගී කර ගනිමින් සීමා කරගනු පෙනේ. ඇඳුම් පැළඳුම්වල සිට විවාහය තෙක් ම එවැනි සීමා පවත්වාගෙන තිබේ. වයස, කාය ශක්තිය, නක්ෂත්‍රය, කුලය, ආගම, ආර්ථිකය රැකී රක්ෂා ආදිය ද ඒ සඳහා බලපාන බව පැහැදිලි වේ.

සරලව රමණය යනු රති සැප විඳීමේ මහඟු විධියක් බව දනු මනාය. එහෙත් රති සැප විඳීමේ එකම ක්‍රමය එය නොවෙයි. රමණයේදී සිරුරේ ඉන්ද්‍රියන්ට ලැබෙන සැපය ද මනසට දැනෙන සැපය ද රති සැපයම වෙයි. මෙලෙස රතිය යනු සැපයක් ද රමණය යනු එම සැපය ලැබීමේ විදියක් ලෙස ද සැලකිය හැකි ය. තවත් ලෙසකින් බැලූ කල රමණය යනු දෙදෙනෙකු අතර මිතු දමේ උච්චයක් ලෙස ද දැකිය හැකි ය. එමෙන් ම සෑම මිතුදමක් ම

රමණය නමැති උච්චයට යා යුතු යැයි මින් අදහස් නොකරයි. එසේ ම රමණය යනු මිතු දමකට යා හැකි ඉහළම උච්චය ද නොවේ.

විවිධ අගමික දේශනාවන් මගින් ලිංගික කාමයට යම් යම් සීමාවන් ඇති කරයි. එයට හේතුව ආගම්වල පරමාර්ථවලට අනුව ස්ත්‍රී-පුරුෂ චර්යාවන් වඩාත් සදචාර සම්පන්න ලෙස ගොඩ නැගීම සඳහා ය. මානව ලිංගිකත්වය පිළිබඳ මිනුම් දඬු සැකසෙන්නේ ඒ අනුව ය. ඒක භාර්යා ව්‍රතය, ඒක පුරුෂ ව්‍රතය පතිව්‍රතාව ආරක්‍ෂා කිරීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් බැහැරවීම, බ්‍රහ්මචාරී ජීවිත ගත කිරීම, පමණක් නොව කාමභෝගී ජීවිත ගත කරන ස්ත්‍රීන්ට සහ පුරුෂයින්ට වුව ද, ගණිකා වෘත්තියේ නියැලෙන්නන්ට වුව ද යම් කිසි ප්‍රමිතීන් පවතී. ඔවුහු සතුන් මෙන් මහ මග මෛවුන්දම් සේවනයෙහි නොයෙදෙති. උපරිම ලිංගික ආශ්වාදය සූරතාන්තයට පත්වීම මෙන් ම දීර්ඝ වේලාවක් ලිංගික චර්යාවෙහි යෙදීම, විවිධ ඉරියව් අනුග මනය කිරීම මෙන් ම අනවශ්‍ය ගැබ් ගැනීම් වැළැක්වීම, දරුවන් අතර පරතරයක් ඇතිවන පරිදි ප්‍රජනනයට අදළවන පරිදි ලිංගිකව හැසිරෙන, කාල කළමනාකරණය ආදී සියල්ල මානව ලිංගිකතාවට එක් කළ අතරම මිනිසා විසින් අනෙක් සත්ත්ව කොට්ඨාසයන් ආශ්‍රිතව මේවා යොද ගනිමින් සතුන්ගේ ලිංගික ක්‍රියාවලිය ද හසුරුවන බව පෙනේ. එනම් අනෙකුත් ක්‍ෂේත්‍රවල දී මෙන් ම ලිංගිකත්වය ආශ්‍රිතව ද මිනිසා ස්වකීය ආධිපත්‍ය පවත්වාගෙන යාමට උත්සුක වී ඇත. ලිංගික කාමය, ආදරය, සෙනෙහස, ආලය, දයාව, කරුණාව, මෛත්‍රීය, ඉවසීම ආදිය සුමට චිත්තවේගීය තත්ත්වයන්ගෙන් යම්කිසි පාලනයකට, සදචාරාත්මක භාවිතයකට පත් කරයි. සතුන්ට වඩා ලිංගික කාමය ආශ්‍රිත ශිෂ්ටත්ව ලක්‍ෂණයන්, සභ්‍යත්ව ව්‍යවහාරයන් මිනිසාට හුරුවන්නේ යථෝක්ත මනෝභාවයන්ගෙන් පෙරී එන බැවිනි. එය කෙටි කාලීන කායික වින්දනයක් වුව ද දීර්ඝ කාලීන මානසික වින්දනයක් බවට පත්වන්නේ ඒ අනුව ය. ස්ත්‍රී-පුරුෂ දෙදෙනෙකුගේ වින්දනීය ලිංගික සම්බන්ධතාව හේතු කොට ගෙන ජනිත වන මිනිසා උපතින්ම රැගෙන එන ඉන්ද්‍රිය පිනවීම, උත්තේජන ප්‍රතිචාර (Stimulus-Response) ක්‍රියාවලිය හැඟීම් දැනීම් ඇතිවීමේ (Sensitive) සංවේදීතාව සන්නිවේදනය කෙරෙහි බලපාන මුඛ්‍යතම සාධකයක් ලෙස දැක්විය හැකි ය.

බුදු දහමට අනුව මිනිසාගේ විමුක්ති සාධනයට බාධා කරන, සංසාර ගමනට ඇද දමන අභියෝග හතරක් පිළිබඳ අංගුත්තර නිකායෙහි දක්වා ඇත. එනම්

1. කාමයෝගෝ - කාම යෝගය,
2. භාව යෝගෝ - භාව යෝගය,
3. දිට්ඨී යෝගෝ - දිට්ඨී යෝගය,
4. අවිජ්ජායෝගෝ - අවිද්‍යා යෝගය වශයනි.

(අංගුත්තර නිකා ය. 11, 11963:20)

මෙහි ප්‍රථම කොට දක්වන කාම යෝගය අන් අන් සියලු අභියෝග ඇති කිරීමෙහි හේතු සාධක වේ. එම කාම යෝගය කෙසේ ද යත් තවදුරටත් මෙසේ විස්තර කර දක්වා ඇත.

> "තස්ස කාමානං සමුදයඤ්ච, අත්ථ ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණංච යථාභූතං අප්පජානතෝ යෝ කාමේසු කාමරාගෝ කාම නන්දි කාම සිනෙගෝ කාම මුච්ඡා, කාම පිපාසා, කාම පරිලාහෝ කාමජ්ඣෝසානං කාම තණ්හා සානුසේති." (අංගුත්තර නිකාය 11, 1963:20)

"කාමයන්ගේ හට ගැනීම, බිඳීම, එහි පවත්නා වින්දනය, ආදීනවය සහ ඉන් මිදීම, නිස්සරණය නියම වශයෙන් නොදත් පුද්ගලයා වස්තු කාමයෙහි, කාම රාගයෙන්, කාම සතුටින්, කාම ආදරයෙන්, කාම මූර්ඡාවෙන්, කාම තෘෂ්ණාවෙන් කාම දැවිල්ලෙන්, කාමයෙහි එල්බ ගැනීමත් මෙන් ද ඒ කාම තෘෂ්ණාවේ හට ගැනීමයි. ජනිත වීමයි." ලෙස අර්ථ කථනය වේ. මානවයා තුළ සහජාසයක් ලෙස, ආහාර, නින්ද, පිපාසය ආදිය මෙන් ම කාම සේවනය ප්‍රමුඛ කොටගත් ලිංගික සම්බන්ධතාව, මෛථුනය හෙවත් රතිලිංගිකතාව ද සමනය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. එය පුහුදුන් ජීවිත ගත කරන්නන්ගේ ජෛවීය අවශ්‍යතාවක් ලෙස හඳුනා ගනු ලබයි. එසේ වුවත් බුදු දහම එය හඳුන්වන්නේ පරම විමුක්තිය ලඟා කර ගැනීමේදී පවත්නා වූ බාධකයක් ලෙසයි. එහෙත් පුහුදුන් ජීවිත ගත කිරීම බුදු දහම ප්‍රතික්ෂේප නොකරයි. එබැවින් ඒ සඳහා සීමාවන් පනවන්නේ විශේෂයෙන් භික්ෂු - භික්ෂුණී වශයෙන් හඳුන්වන සාසනික සංස්ථාව සඳහා පූර්ණකාලීනව සම්බන්ධ වූ ඇප, කැප වූ පිරිසටය. විනය ශික්ෂාවන්හි ප්‍රධාන වශයෙන්ම මෛථුන ධර්ම සේවනය භික්ෂුවකට හෝ භික්ෂුණියකට නැවත ආපසු නිවැරදි කළ නොහැකි තරමේ වරදක් ලෙස දක්වා ඇත.

> "සෝපන භික්ඛු භික්ඛුනං සික්ඛා සජීව සමාපන්නෝ සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවීකත්වා මෙථුනං ධම්මං පතිසේවෙය්‍ය අන්තමසෝ තිරච්ඡානගතායපි, පරාජිකෝ හෝති අසංවාසෝ" (සෝරත හිමි, රතනරංසි හිමි(සංස්). 2007:21)

යම් භික්ෂුවක් භික්ෂූන් පිළිබඳ අධිශීල ශික්ෂාවන්ට පැමිණියේ, උපසම්පදව ප්‍රතික්ෂේප නොකොට දුර්වල බව ද නොකියා යටත් පිරිසයින් තිරිසන්ගත මාගමක් සමඟ ද මෙවුන්දම් සෙවී නම් පරාජික වූයේ වෙයි. එබන්දෙක් (පියවි මහන බමුණන් සමඟ) සහවාසයට නුසුදුස්සෙක් වෙයි. ඒ අනුව එය භික්ෂුවකගේ ප්‍රබල පරාජිකාවක්, පරාදවීමක් වන අතර එවැන්නෙක් නැවත භික්ෂූන් සමඟ එක්ව වාසයට නුසුදුසු වේ. මන්දයත් තමන් ලද පිනවීම අන්‍යයන්ට ද ප්‍රකාශ කර අන් අය ද ඒ සඳහා පොළඹවා ගත හැකි බැවිනි. අභ්‍යන්තරයේ දැවි දැවී තිබෙන කාමාග්නිය ඕනෑම මොහොතක මතුවිය හැකි ය. එය දැඩිව පාලනය කර ගතහොත්, කළමනාකරණය කරගත හොත් ලෝකෝත්තර ගාමියාගේ පරමාර්ථ සාධනය කර ගැනීමට එය උපයුක්ත වන බැවිනි. එහෙත් මානව වර්ගයාගේ පැවැත්මට එම රාගය,

රතිය හෙවත් කාමය දල්විය යුතුම ය. එය අසීමාන්තික වීම නිසා උද්ගතවිය හැකි විවිධ ගැටලු පාලනය කිරීම සඳහා ආගම් නීති, ආචාර ධර්ම, සිරිත් විරිත් ආදිය බලපා තිබේ.

බෞද්ධ දේශනාවේ භික්ෂු භික්ෂුණී විනය ප්‍රතිපද ආශ්‍රිතව විවිධ ලිංගික චර්යා පාලනය කරන අවස්ථා හමු වේ. සිහිනයෙන් හැර දැන දැනම ශුක්‍ර මෝචනය, රාගී අදහසින් අතිනත ගැනීම, කෙස් අල්ලා ගැනීම, අතින් අවයව ස්පර්ශය හා ස්ත්‍රියක සමඟ කායික ස්පර්ශය, ස්ත්‍රියකගේ වස මග, පස මග පිළිබඳ අසභ්‍ය ව්‍යවහාරයේ යෙදීම, ස්ත්‍රි පුරුෂ අඹු සැමි හෝ සොරඹු සැමි ලිංගික කටයුතුවලට උදව් කිරීම, මෛථුනයට සුදුසු රහසිගත තැනක ස්ත්‍රියක සමඟ සිටීම, යම් තැනක සිට ස්ත්‍රියක සමඟ අසැබි ව්‍යවහාරයෙන් කතා කිරීම හුදකලාව ස්ත්‍රියක සමඟ අසුන්ගතව සිටීම, යම් භික්ෂුණියක් රාගී අදහස් ඇති පුරුෂයකු ලවා ගෙලෙන් පහළ දනහිසින් උඩ සිරුර ස්පර්ශය, පිරි මැදීම, අතින් ගැනීම පෙළීම හෝ මෙවැනි දේ ඉවසා සිටීම, යම් භික්ෂුණියක් රාගී අදහසින් පුරුෂයකුගේ අත ඇල්ලීම, චීවර කෙළවර ඇල්ලීම, සමීපයෙහි සිටීම, කථා කිරීම, කලින් සලකුණු කළ තැනකට යාම, පුරුෂයකු බලාපොරොත්තුව සිටීම, මුවා වූ තැනකට යාම, අනාචාරය සඳහා කය පුරුෂයාට දැක්වීම, යෝනි ප්‍රදේශය සම්බාහනය (මානෙල් පෙත්තකින් තරමින්වත්), මට සිලිටි ලාකඩමය දෙයක් හෝ අන් දෙයක් යෝනි මාර්ගයට ඇතුල් කිරීම, යෝනි මග ජලයෙන් පිරිසිදු කිරීමේ දී දැඟුලකට වඩා ඇඟිලි ඇතුළට දැමීම, අඳුරු රාත්‍රීයන්හි පුරුෂයින් සමඟ සිටීම, ආවරණ ස්ථානවල පුරුෂයන් සමඟ සිටීම, පුරුෂයන් සමඟ එකලාව විදී සැරීම, එක ඇඳක විසීම (භික්ෂුණීන් දෙදෙනෙක්) හා එක පොරෝණය පෙරවීම, (සෝරත හිමි, රතනහංසි හිමි(සංස්), 2007) මේ වැනි වූ දේවලින් වැලකී සිටිය යුතු බව විනය දහමේ පිළිගැනීමයි. ඒ සියල්ල කාම රාගය වැඩෙන ක්‍රියාවන් විය හැකි බැවින් ඒවා සීමා කර තිබේ.

රාගික චර්යාවන්ට යොමු වූ විට එයින් අත් මිදීම දුෂ්කර වේ. එසේ ම කෙලෙස් වැඩෙන තණ්හා උපදවන ක්‍රියාවන් වන බැවින් ලෝකෝත්තර පරමාර්ථවලට ප්‍රබල බාධාවක් බවට පත් වේ.  සෑම විට ම විනය ශික්ෂාවක් පනවන්නේ ඊට අදාළ සමජ පුද්ගල ව්‍යවහාරයක් අත්දැකීම් වූ විට ය. එයින් ප්‍රකට වන්නේ ලිංගික චර්යාවන්ට සම්බන්ධ එවැනි දෑ තත්කාලීන සමාජයේ සිදු වී ඇති බවයි. ස්ත්‍රී පුරුෂ ලිංගික සම්බන්ධතාවේ ද එවැනි සන්නිවේදනාත්මක චර්යා උපයෝගී වී ඇත.

ස්ත්‍රී - පුරුෂ සංයෝගයේ දී බලපාන සාධක පිළිබඳ බුදු දහමේ අපූර්ව ලෙස විග්‍රහයට පාත්‍ර වෙයි.

ඉත්ථින්ද්‍රියං - ස්ත්‍රි ඉන්ද්‍රිය  - පුරිසින්ද්‍රියං - පුරුෂ ඉන්ද්‍රිය

ඉත්ථිකුත්තං - ස්ත්‍රි කෘත්‍ය  - පුරිසකුත්තං - පුරුෂ කෘත්‍ය

ඉත්ථිකප්පං - ස්ත්‍රී ආකල්පය - පුරිසාකප්පං - පුරුෂාකල්පය

ඉත්ථිවිධං - ස්ත්‍රී ආකාරය - පුරිසවියං - පුරුෂ ආකාරය

ඉත්ථිංන්දං - ස්ත්‍රී කැමැත්ත - පුරිස ඡවදං - පුරුෂ කැමැත්ත

ඉත්ථිසරං - ස්ත්‍රීස්වරය - පුරිස සරං පුරුෂ ස්වරය


ඉත්ථ්‍යාලංකාරං - ස්ත්‍රී අලංකාරය - පුරිසාලංකජං - පුරුෂාලංකාරය

(අංගුත්තර නිකාය 1964 ; 364)

ස්ත්‍රී - පුරුෂ දෙපාර්ශවය මෙම සාධක පිළිබඳ මෙනෙහි කර මේ මාගේ ශරීරයයි යනුවෙන් මමායනයෙන් එහි ඇලෙයි. බැඳෙයි. එයින් සතුටු වෙයි. පසුව එකිනෙකා විරුද්ධ ලිංගිකයා කෙරෙහි ද ආකර්ෂණයක් ඇති කර ගනියි. එය කායික හා මානසික තෘප්තියක් ආශ්වාදයක්, වින්දනයක් බවට පත්කර ගනියි. මෙය ආකර්ෂණය ස්ත්‍රී - පුරුෂ සංයෝගය හෙවත් එක්වීම කෙරෙහි බලපාන අතර, මෙය ලිංගික සංසර්ගයේ කාමාස්වාද රතියෙහි මූලික සන්නිවේදනාත්මක පියවර බවට පත්වෙයි.

ස්ත්‍රී - පුරුෂ ඉන්ද්‍රිය - female - male Organs/sensory, ස්ත්‍රී - පුරුෂ කෘත්‍ය - female - male function , ස්ත්‍රී - පුරුෂ ආකල්ප -female - male attitudes, ස්ත්‍රී - පුරුෂ ආකාර - female - male types, ස්ත්‍රී - පුරුෂ කැමැත්ත - female - male desire/fondness, ස්ත්‍රී - පුරුෂ ස්වරය - female - male tone, ස්ත්‍රී - පුරුෂ අලංකාරය - female - male elegance

ලිංගික සන්නිවේදනයෙහිලා මෙමගින් පදනමක් ගොඩනගා ගැනීමට පුළුවන




**ස්ත්‍රී - පුරුෂ සන්නිවේදන සම්බන්ධතා ආකෘතිය**

xy වර්ණදේහ නිපදවන පිරිමියාද xx වර්ණදේහ නිපදවන ගැහැනිය ද සන්නිවේදනය මගින් හුවමාරු කර ගන්නා නානාවිධ පණිවිඩ හේතු කොටගෙන ඔවුනොවුන් එකිනෙකා දැන හඳුනා ගැනීම, සමීපවීම, ආකර්ෂණය වීම, ආදරය, සෙනෙහස, ප්‍රේමය පෑම, දැකීම, ඇසීම, ආමන්ත්‍රණය, ස්පර්ශය, කාම රාගය උද්දීපනය වීම, ලිංගික සංසර්ගයේ යෙදීම, සුරතාන්තයට

පත්වීම සහ පුරුෂයාගේ පාර්ශවයෙන් ශුක්‍රාණු මුද හැරීම, ස්ත්‍රියගේ පාර්ශවයෙන් ඩිම්බ නිකුත්වීම, xx-xy වර්ණදේහ සංසේචනයවීම, යුක්තානුව හෙවත් මූලික ජීවාණුව හට ගැනීම දක්වා වන්නා වූ සෑම ක්‍රියාවකටම අදාළව ප්‍රමුඛ වන්නේ සන්නිවේදනය යි.

**සමාලෝචනය**

ස්ත්‍රී-පුරුෂ වශයෙන් මානව සමාජය මූලික වශයෙන් වර්ගීකරණය වන්නේ ඔවුනොවුන්ගේ ලිංගික අවයව හා නිසර්ග වශයෙන් නියමව ඇති ලිංගික චර්යාවන් සිදු කිරීමට ය. මානවයා කායික හා මානසික වශයෙන් අනන්‍යතාවන් ගොඩනගාගෙන ඇත්තේ ගැහැණු-පිරිමි භාවයන් අනුව ය. පවුල් ඒකකයෙන් ඇරඹෙන සමාජීය කාර්යයන් නියමව ඇත්තේ ද ස්ත්‍රී-පුරුෂ ලිංගිකත්වයට අනුව බව නිගමනය කෙරේ. ලිංගය (Sex) යනු ජීව විද්‍යාත්මක වශයෙන් හිමි වී ඇති ස්ත්‍රී-පුරුෂ ලිංගිකාවයව සහිත ශාරීරික හා මානසික ව්‍යුහයන් වේ. ලිංගිකත්වය (Gender / Sexual) යන්නෙන් ස්ත්‍රී-පුරුෂ වශයෙන් සමාජයේ ජීවත්වීමේදී ඔවුනට පැවරී තිබෙන කාර්යභාරය ඉටු කිරීමයි. එහිදී සිදු වන්නේ ගැහැණුන් හා පිරිමින් විරුද්ධ ලිංගිකයන් ලෙස එකිනෙකා ආකර්ෂණය කරමින් විවිධ සන්නිවේදනයන් මගින් සම්බන්ධතා ඇති කර ගනිමින්, මෛථුන සේවනයෙහි යෙදෙමින්, ප්‍රජනනයත්, වින්දනයත් සපුරා ගනිමින් ජීවත්වීම බව තහවුරු වේ. ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවය අතර ඇස්, කන්, නාස් ආදී ඉඳුරන්, ස්නායු පද්ධතිය, මොළය, ආදිය පදනම් කරගෙන සිදුවන ලිංගික උත්තේජන (Sex Stimulus) හා ලිංගික ප්‍රතිචාර (Sex Response) අනුව ලිංගිකත්ව සන්නිවේදනය (Sexual Communication) සිදු වේ. එය සන්නිවේදනයේ ජීව විද්‍යාත්මක ප්‍රවේශයක් (Biological Approach of Communication) ලෙස අනාවරණය කළ හැකි ය.

ලිංගිකත්ව සන්නිවේදනයේ ස්ත්‍රී-පුරුෂ වශයෙන් ගැනෙන පුද්ගල චර්යා රටාවන්, සම්බන්ධතා ව්‍යුහයන් උපයෝගී වේ. ස්ත්‍රියක් හා පුරුෂයෙක් නිල වශයෙන් නැතහොත් සමාජ සම්මතානුකූලව ලිංගික ජීවිත ගත කිරීමට, ප්‍රේම සම්බන්ධතා විවාහ සම්බන්ධතා ඔස්සේ අඹු-සැමි හෙවත් ස්වාමි-භර්යා සම්බන්ධතාවකට අවතීර්ණ විය යුතු ය. පවුල් ඒකකය ගොඩ නැගෙන්නේ මූලික වශයෙන් එකී ලිංගික නිදහස භුක්ති විඳිමේ ප්‍රතිඵලයක් ලෙස ය. එම සම්බන්ධතාවන් අනාවරණය කෙරෙන අධ්‍යයන ලිංගිකත්ව සන්නිවේදනයේ සමාජ විද්‍යාත්මක ප්‍රවේශයක් (Sociological Approach of Sexual Communication) ලෙස නිගමනය කළ හැකි ය. කෙතරම් සමාජ සම්මතයන්, ආචාර ධර්ම, සංස්කෘතික වත් පිළිවෙත් අනුව ස්ත්‍රී-පුරුෂ සම්බන්ධතා ගොඩනැගුණත් ඔවුන් දෙදෙනා අතර සිදුවන කායික සම්බන්ධතා ආස්වාද ජනක, වින්දන පරාසයක් දක්වා ගමන් කරයි. ඒ සඳහා ආදරය, ප්‍රේමය, සෙනෙහස, ආලය, කාමය, රතිය ආදී චිත්තවේගීය ස්වභාවයන් උද්දීපනය වේ. මේවා විවිධ සමාජ සංස්කෘතික සම්මුතීන් විසින් පනවන ලද සීමාවන් ඇතුළත සිදු වුව ද යථෝක්ත චිත්තවේගීය පරිසරය, ආස්වාදය, රසය, සැපය, ආකර්ෂණීය භාවය යනාදිය ඇති වේ. මෙය ලිංගික සන්නිවේදනයේ, මනෝ විද්‍යාත්මක ප්‍රවේශයක් (Psychological Approach of Sexual Communication) ලෙස තහවුරු කරගත හැකි ය. ලොව එතෙක්-මෙතෙක්

නිර්මාණය වී ඇති ආගම්, කලාවන්, විද්‍යාවන් යන ක්ෂේත්‍ර සියල්ලට ලිංගිකත්වය යන්න සම්බන්ධ වේ. එක් පසෙකින් ඒ සියල්ල බහුල වශයෙන් ස්ත්‍රීන් හා පුරුෂයින් සහිත මානව සමාජ ක්‍රියාවලිය සමඟ සම්බන්ධ වන බැවිනි. දෙවියන්, දේවතාවන්, යකුන්, යක්ෂණියන්, රහතුන්, මෙහෙනින් වහන්සේ, බුදුන් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ආදියේ දී ආගම් හා බැඳෙන ස්ත්‍රී, පුරුෂ ලිංගික අනන්‍යතාවන් පැහැදිලි කෙරේ. ආගමික ශික්ෂණවේදයන්හි ප්‍රධාන වශයෙන් කාමය, රතිය, මෛථුනය කළමනාකරණය කිරීමට අදාළව දේශනාවන් ඉදිරිපත් වේ. ආගමික සදාචාරයේ දී ලිංගික සංයමයට ප්‍රමුඛතාවක් ලැබේ. ඒ අන් කවරක් නිසාවත් නොව, අනෙකුත් සියලුම ගැටලු උත්පන්නවීම පාලනය කිරීමට ලිංගිකත්වය සම්බන්ධ සීමාවන් හේතුවන බැවිනි. බුදු දහමේ පළමුවන භික්ෂු පාරාජිකාව මෛථුන ධම්ම සේවනය ලෙස දක්වන්නේ එම නිසා ය. මෙම අධ්‍යයනය මගින් හඳුන්වා දෙන ලද ස්ත්‍රී - පුරුෂ සන්නිවේදන සම්බන්ධතා ආකෘතිය මගින් මානව ලිංගිකත්වයේ ස්වභාවයත් එහි සාරවත් භාවිතයත් සඳහා නව ශික්ෂණ වේදයකට මග සලස යි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අංගුත්තර නිකාය, i ii iii iv, (1960-70). සම්බුද්ධත්ව ජයන්ති ප්‍රකාශනය. කොළඹ.

අභයසුන්දර, ප්‍රණීත්. (2003). *මානව සමාජගත පවුල් සංකල්පය,* එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඇනට්මාරි, ජසින්තා. (පරි) (රූක් ස්ටැෆඩ් ෆීල්ඩ් කර්තෘ). (2012). *ශක්තිමත් සාර්ථක විවාහ ජීවිතයක් උදෙසා.* පහන් ප්‍රකාශන. කොළඹ.

ඇතුගල, ආරියරත්න. (1998). *සන්නිවේදන සිද්ධාන්ත (න්‍යාය, ආකෘති සහ සංකල්ප).* එස් ගෝඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ. (සංස්). (1959). *අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය.* ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

මහානිද්දේස අට්ඨකතාව. (1921). කොළඹ

මහානිද්දේස පාළිය. (1961). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. කොළඹ.

මුදියන්සේ, මීගල. (පරි), (1999). *කාම සූත්‍රය.* ABC පබ්ලිෂර්ස්. කැලණිය.

මනුරත්න, එම්. ජී. (2004). *ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පවුල.* ආරිය ප්‍රකාශකයෝ. වරකාපොළ.

විජේතුංග, හරිශ්චන්ද්‍ර. (2008). *මහා සිංහල ශබ්ද කෝෂය.* ඇම්. ඩී ගුණසේන සහ සමාගම. කොළඹ.

මජ්ඣිම නිකාය. 1. (1964). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. කොළඹ.

මජ්ඣිම නිකාය. 11 කාණ්ඩය. (1973). *බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා.* කොළඹ.

රණසිංහ ශෂී ප්‍රභාත්. (2001). *යුගදිවි පහන් වැට.* ලක්මාලි ප්‍රකාශකයෝ. නුගේගොඩ.

රාහුල හිමි, වල්පොල. (1964). *බුදුන්වදළ ධර්මය.* දෙහිවල සංස්කෘතික මධ්‍යස්ථානය.

රාජපක්ෂ, චන්ද්‍රසිරි. (2003). *ජනසන්නිවේදන මූලධර්ම*-1. කර්තෘ ප්‍රකාශන. ෆස්ට් ප්‍රින්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (මුද්‍රණය). කොළඹ.

රත්නපාල නන්දසේන. (2001). *මානව විද්‍යාව.* ආරිය ප්‍රකාශකයෝ. වරකාපොල.

චන්ද්‍රවංශ, ආරියරත්න. (පරි). (2013). *පිරිමි සහ ගැහැණු මෙතරම් වෙනස් ඇයි.* විජේසූරිය, ග්‍රන්ථ කේන්ද්‍රය. පුංචි බොරැල්ල.

බාලසූරිය, ප්‍රදීප් කුමාර. (පරි). )2012). *ගැහැණුන්ට වඩා පිරිමින් වෙනස්.* විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය. මුල්ලේරියාව.

පරණගම, ඩී. ඇම්. (2003). *අනංගයා හා රති ලිංගිකතාවෙහි විද්‍යාත්මක පදනම.* එස්. ගොඩගේ සහ සමාගම. කොළඹ

පරණගම, ඩී. ඇම්. (2003). *අනංගයා හා රති ලිංගිකත්වයෙහි විද්‍යාත්මක පදනම.* එස්. ගොඩගේ සහ සමාගම. කොළඹ.

කුරේ, ක්‍රිශාන්ත් නිරන්ජන්. (2011). *අත්‍යවශ්‍ය ලිංගික දැනුම.* ඩී. එන්. සී. ප්‍රකාශන. මොරටුව.

වජිරඤාණ හිමි, පරවහැර. (සංස්). (1927). *විසුද්ධිමාර්ග සන්නය.* මහා බෝධි යන්ත්‍රාලය. කොළඹ.

සුත්ත නිපාතය, (1977). *බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා.* කොළඹ.

යාපා, මුනිදාස සෙනරත්. (1997). (පරි). *කාම සූත්‍රය.* රත්න පොත් ප්‍රකාශකයෝ කොළඹ.

සෝමතිලක ආරියදාස. (1979). *ප්‍රීතිමත් ජීවිතයකට මනෝ විද්‍යාව.* ජීවන ප්‍රකාශන. අතුරුගිරිය.

සෝරත හිමි, ගොඩිගමුවේ, රතනරංසි හිමි, කනදූල්ලේ. (සංස්) (2007). *උභය ප්‍රාතිමෝක්ෂය.* රේරුකානේ චන්දවිමල ධර්ම පුස්ත සංරක්ෂක මණ්ඩලය. පොකුණුවිට.

දිසානායක, විමල්. (1977). *මානව සන්නිවේදනය.* ලෙක් හවුස් සමාගම. කොළඹ.

ජිනරතන හිමි, ඉස්වැල්ලේ. (සංස්). (1929). *කර්ම විභාගය.* විද්‍යාර්ථ ප්‍රකාශන යන්ත්‍රාලය. කොළඹ.

ජයසිංහ,ඒ.කේ.ජී., (2006). *ස්ත්‍රී පුරුෂ සමාජභාවය.* කඩුල්ල ප්‍රකාශන. කඩවත.

ඥානවිමල හිමි, කිරි ඇල්ලේ. (සංස්) (1986). *පූජාවලිය.* ගුණසේන සහ සමාගම. කොළඹ.

Pali English Dictionary. (1979). DTS. London.